*සැ. යු.* - 2010.10.15 වැනි දින පළ වූ අංක 1,676 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2010 වර්ෂය සඳහා බලපිටිය අධිකරණ කලාපයට අයත් සාමාන්‍ය ජූරි සභිකයින්ගේ හා විශේෂ ජූරි සභිකයින්ගේ නාමාවලියක් (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයට පමණක් අයත්) මෙම *ගැසට්* අංකය හා එයට අදාළ පළ කරන දිනය යටතේ පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,677 - 2010 ඔක්තෝබර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2010.10.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1798 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1804 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ඔක්තෝබර් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# රජයේ නිවේදන

අංකය : ප්‍ර. නො. 11/2/35/11/2010 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2010.10.25 වැනි දින සිට 2010.11.08 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2010.11.15 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "කිරිල්ල" දරන කොට්ඨාසයේ 37 වෙළුමේ 217-218 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ කිරිල්ලපන රේල්වේ ඇවිනිව් හි පිහිටි වරිපනම් අංක 32/1 දරන අ. 0, රූ. 0, පර්. 19.87 විශාලත්වයෙන් යුත් අඹගහවත්ත නමැති ඉඩමේ වී. ඒ. එල්. සේනාරත්න මිනින්දෝරු තැනගේ 1952.12.01 දින මැන සාදන ලද අංක 404 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 558ඊ දරන කොටසට මායිම්,<br>*උතුරට :* ලොට් 558ඩී ;<br>*නැගෙනහිරට :* ලොට් 558ජී (මාර්ග රක්ෂිතය),<br>*දකුණට :* ලොට් 558 එෆ් ;<br>*බස්නාහිරට :* 557හි ලොට් ඒ | 1. ඒ. එෆ්. බී. ද ඩබ්. තිලකරත්න ප්‍ර. නො. විසින් 1953.04.22 ලියා සහතික කළ අංක 383 දරන විකුණුම්කර ඔප්පුව<br>2. ජේ. එස්. පරණවිතාන ප්‍ර. නො. විසින් 1955.07.20 දින ලියා සහතික කළ අංක 3711 දරන උකස් ඔප්පුව<br>3. ටී. බී. එන්. රිචර්ඩ්ස් ප්‍ර. නො. විසින් 1954.03.26 දින ලියා සහතික කළ අංක 272 දරන ගිවිසුම් ඔප්පුව |
| එම 55 වෙළුමේ 25-26 දරන පත් ඉරුව | -එම- | 1. වී. සේනාතිරාජා ප්‍ර. නො. විසින් 1963.02.27 දින ලියා සහතික කළ අංක 17917 දරන ගිවිසුම් ඔප්පුව |
| එම 37 වෙළුමේ 221-222 දරන පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ කිරිල්ලපන රේල්වේ ඇවිනිව් හි පිහිටි අ. 0, රූ. 0, පර්. 28.37 විශාලත්වයෙන් යුත් අඹගහවත්ත නමැති ඉඩමේ වී. ඒ. එල්. සේනාරත්න මිනින්දෝරු තැනගේ 1952.12.01 දින මැන සාදන ලද අංක 404 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 558ජී (මාර්ග රක්ෂිතය) දරන කොටසට මායිම්,<br>*උතුරට :* ලොට් 558ඒ ; | 1. එච්. වී. රාම් ප්‍ර. නො. විසින් 1953.03.30 ලියා සහතික කළ අංක 417 දරන විකුණුම්කර ඔප්පුව<br>2. එස්. එල්. මුණසිංහ ප්‍ර. නො. විසින් 1953.03.24 දින ලියා සහතික කළ අංක 1783 දරන විකුණුම් ඔප්පුව<br>3. ඒ. එෆ්. බී. ද ඩබ්. තිලකරත්න ප්‍ර. නො. විසින් 1953.04.22 දින ලියා |

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "කිරිල්ල" දරන කොට්ඨාසයේ, 37 වෙළුමේ 221-222 දරන පත්ඉරුව (සම්බන්ධිතයි) | *නැගෙනහිරට* : ලොට් 558එච් (ඉතිරි කොටස), *දකුණට* : රේල්වේ ඇවනිව් ; *බස්නාහිරට* : 558බී සිට 558එෆ් | සහතික කළ අංක 383 දරන විකුණුම් ඔප්පුව<br>4. ජේ. එස්. පරණවිතාන ප්‍ර. නො. විසින් 1953.04.28 දින ලියා සහතික කළ අංක 3112 දරන විකුණුම් ඔප්පුව |
| එම 38 වෙළුමේ 135-136 දරන පත්ඉරුව | එම | 1. ජේ. ඇස්. පරණවිතාන ප්‍ර. නො. විසින් 1953.12.12 දී ලියා සහතික කළ අංක 3296 දරන විකුණුම්කර ඔප්පුව<br>2. ජේ. ඇස්. පරණවිතාන ප්‍ර. නො. විසින් 1955.04.26 දින ලියා සහතික කළ අංක 3661 දරන විකුණුම්කර ඔප්පුව<br>3. ජේ. එස්. පරණවිතාන ප්‍ර. නො. විසින් 1955.07.20 දින ලියා සහතික කළ අංක 3711 දරන උකස් ඔප්පුව. |

10-721

---

අංකය : ප්‍ර. නො. 11/2/35/16/2010 පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2010.10.22 වැනි දින සිට 2010.11.05 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2010.11.12 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
අංක 243/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "දෙහිවල" දරන | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව | වී. ඊ. සෙල්වරාජා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1981.01.08 ලියා සහතික කළ අංක 64 දරන විකුණුම්කර ඔප්පුව |

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොට්ඨාසයේ 55 වෙළුමේ 119-120 දරන පත් ඉරුව (සම්බන්ධිතයි) | තුළ ස්ටේෂන් පාරේ (දැන් මේජර් එල්. වී. ගුණරත්න මාවත) පිහිටි අ. 0, රූ. 0, පර්. 10.20 විශාලත්වයෙන් යුත් ඇපොතිකාරියාවත්ත නමැති ඉඩමේ ඩබ්. අහංගම මිනින්දෝරු තැනගේ 1980.07.23 දින මැන සාදන ලද අංක 2384 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 5638 දරන කොටසට මායිම්, *උතුරට* : ලොට් 56 බී 6 ; *නැගෙනහිරට* : ලොට් 56 බී 7 ; *දකුණට* : ලොට් කේ 7 ඒ ; *බස්නාහිරට* : 56 බී 9 | වී. ඊ. සෙල්වරාජා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1981.01.08 ලියා සහතික කළ අංක 64 දරන විකුණුම්කර ඔප්පුව |
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "දෙහිවල" දරන කොට්ඨාසයේ 55 වෙළුමේ 103-104 දරන පත්ඉරුව | ඉහත කී ඇපොතිකරියාවත්තේ කැබලි අංක 56ජේ දරන පාරක් සඳහා වෙන් කළ අ. 0, රූ. 0, පර්. 19.5ක් විශාලත්වයෙන් යුත් එච්. එෆ්. බී. විජේසේකර මිනින්දෝරු තැනගේ අංක 490 දරන පිඹුරේ ප්‍රකාර මායිම්, *උතුරට* : ලොට් 56 සී, 56 ඩී, 56ඊ ; *නැගෙනහිරට* : ලොට් 57 ඒ 1 ; *දකුණට* : ලොට් 56 එෆ්, 56 ජී, 56 එච්, 56 1 ; *බස්නාහිරට* : ලොට් 56 බී. | එම |

10-720

---

එල්. ඩී. බී. 277/40.

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

18 වැනි වගන්තිය යටතේ නියමය

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 18 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිනි පවිත්‍රා වන්නිආරච්චි වන මම, මේ නියමය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා "ආරක්ෂිත ස්මාරක" වශයෙන් සළකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

ඉහත කී ස්මාරක සම්බන්ධයෙන් වන දැන්වීම් පුරාවස්තු ආඥාපනතේ 19 වැනි වගන්තිය ප්‍රකාරව 2010 මැයි මස 26 වැනි දින අංක 1,656 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලදී.

නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි,
ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිනි.

2010 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ස්මාරක ලේඛනය***

*කුරුණෑගල දිස්ත්‍රික්කය* :-

01. වයඹ පළතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 381 කුරුණෑගල නගරය උතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශ්‍රී ශෛලතලාරාම විහාර භූමියට අයත් කටාරම් කෙටූ ලෙන.

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 771 හඳමාගම ග්‍රාම නිලධාරි වසමේ බිසෝගල නැමැති ස්ථානයේ ඇති කටාරම් කෙටූ ලෙන.

03. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්ලවපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පහළ ගැට්ටුවාන ග්‍රාමයේ ඇති මහදුරයාගේ සොහොන.

04. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 822 විල්බාව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි විල්බාව රජමහා විහාර භූමියට අයත් බ්‍රාහ්මීය සෙල්ලිපිය සහිත කටාරම් කෙටූලෙන.

05. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 771 ගිණිකරාව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගිණිකරාව රජමහා විහාර භූමියට අයත් කටාරම් කොටන ලද ලෙන් විහාරය.

06. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 771 හඳමාගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හඳමාගම විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන්.

07. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 440 අරංකැලේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බන්නැග්ගම බණමඩුව නැමැති ස්ථානයේ ඇති පෞරාණික නටබුන් ගොඩනැගිලි සංකීර්ණය.

08. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 464 මාලගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි උඩුබඩගම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.

09. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 329 දිවුල්ලෑගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේවැව පුරාණ විහාර භූමියට අයත් පැරණි පිළිමගෙය.

10. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආරගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගලදෙණිකඩ පුරාණ විහාර භූමියට අයත් කටාරම් කෙටූ ගල්ලෙන සහ පැරණි චිත්‍රමූර්ති සහිත කුඩා ලෙන් විහාරය.

11. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැඩලිත්තාවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගොනටුවේගෙදර පත්තිනි දේවාල භූමියේ ඇති පැරණි ටැම්පිට දේවාල ගෘහය.

12. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹදෙණි දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි නාගහමුල දේවාල නටබුන් ස්ථානයේ ඇති ගල්කණු සහිත නටබුන් ස්ථානය.

13. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 840 කුරුණෑගල ඊසාන ග්‍රාම නිලධාරී වසමේ කුරුණෑගල මහනගර සීමාවට අයත් ජේතවන පිරිවෙන් භූමියේ ඇති කටාරම් සහිත ගල්ලෙන් දෙක.

*ගාල්ල දිස්ත්‍රික්කය :*

14. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 204 තෙලිකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තෙලිකඩ ශ්‍රී සුනන්දාරා පුරාණ විහාර භූමියේ ඇති පැරණි සිතුවම් සහ මූර්ති සහිත ප්‍රතිමා ගෘහය.

15. දකුණු පළතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පනංගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පනංගල ගංගරාම විහාර භූමියට අයත් පෞරාණික සිතුවම් සහ මූර්ති සහිත පිළිමගෙය.

16. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 196ඒ වාඩුවැලිවිටිය ගංගාරාම විහාර භූමියේ ඇති පැරණි සිතුවම් මූර්ති සහිත ප්‍රතිමා ගෘහය සහ ස්තූපය.

17. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 204 තෙලිකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අංපිටිය දේවාල භූමියේ ඇති පෞරාණික ගල්කුළුණු.

18. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 216 නාගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ජයසිංහාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ධර්ම ශාලාව.

19. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 31 අමුගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉහළගොඩ සිරිවිජයාරාම විහාර භූමියේ ඇති පැරණි සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය.

*මාතර දිස්ත්‍රික්කය :*

20. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 240ඒ කොළවෙනිගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොළවෙනිගම රජමහා විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය.

*මාතලේ දිස්ත්‍රික්කය :*

21. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොඹවෙල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පලාපත්වල පල්ලෙගනේ පොත්ගුල් විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය සහ ආවාස ගෘහය.

22. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නාගහතැන්න දොඹවෙල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රෙඩ්බානාගම වරකන්ද ගෘප් වතු බංගලාව.

*මහනුවර දිස්ත්‍රික්කය :*

23. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනුවර ග්‍රාම නිලධාරී වසමේ මහනුවර නගරයේ පිහිටි ශාන්ත අන්තෝනි දේවස්ථාන භූමියේ ඇති රැස්වීම් ශාලාව.

24. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 257 මහනුවර ග්‍රාම නිලධාරී වසමේ මහනුවර නගරයේ පිහිටි දේව වීදියේ ඇති මුලාදෑනි මන්දිරය.

25. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බූවැලිකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බූවැලිකඩ පැරණි උසාවි ගොඩනැගිල්ල හා ඊට උතුරු දෙසින් ඇති පැරණි ගොඩනැගිලි හතර (04).

26. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තල්වත්ත ගංගරාම විහාර භූමියේ ඇති ප්‍රතිමාගෘහය.

27. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුදුහුම්පොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සුදුහුම්පොල රජමහා විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය.

28. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වට්ටාරන්තැන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වට්ටාරන්තැන්න පුරාණ ගල්ලෙන් විහාර භූමියේ ඇති කටාරම් කෙටූ ලෙන හා ප්‍රතිමා ගෘහය.

29. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 254 මල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ මහනුවර නගරයේ පිහිටි මල්වත්ත පෝයමළු විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය සහිත පෝය ගෙය.

30. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ මහනුවර නගරයේ පිහිටි නාගවිමාන කන්දේ විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය.

31. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උරුලෑවත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උරුලෑවත්ත පුරාණ විහාර භූමියේ සහ සත්පත්තිනි දේවාල භූමියේ ඇති චෛත්‍ය සහිත කටාරම් කෙටූ ලෙන් විහාරය සහ පියගැට පෙළ.

32. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දංකුඹුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දංකුඹුර පුරාණ විහාර භූමියේ ඇති ටැම්පිට ප්‍රතිමා ගෘහය සහ පැරණි ආවාස ගෘහය.

33. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 615 උඩතලවින්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වෙහෙරගල පැරණි චෛත්‍යය.

*නුවරඑළිය දිස්ත්‍රික්කය :*

34. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩමළුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හඟුරන්කෙත පොත්ගුල් මාළිගා විහාර භූමියේ ඇති පෞරාණික ලක්ෂණ සහිත සංඝාවාසය.

*කළුතර දිස්ත්‍රික්කය :*

35. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 620 හොරේතුඩුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හොරේතුඩුව ගංගාරාම විහාර භූමියේ ඇති පැරණි ධර්මශාලාව.

*කෑගල්ල දිස්ත්‍රික්කය :*

36. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්මඩල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අස්මඩල බොදුරැල්ල හේනවත්ත නැමැති ඉඩමේ ඇති ශිලා ලිපිය සහිත කටාරම් කොටන ලද ලෙන.

37. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්මඩල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අස්මඩල ගල්ගොඩ හේනවත්ත නැමැති ඉඩමේ ඇති ප්‍රාග් ඓතිහාසික සංකේත සහිත ලෙන සහ කටාරම් කොටන ලද ලෙන.

38. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්මඩල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අස්මඩල ලුණුමිදිඇල්ල රක්ෂිතය නමැති ස්ථානයේ පිහිටි කටාරම් කොටන ලද ගල්ලෙන.

39. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්මඩල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඉහළ කඩේ අස්මඩල නැමැති ස්ථානයේ ඇති කටාරම් කොටන ලද ගල්ලෙන.

40. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අතුරුපාන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙගලතිරිය ගලඋඩතැන්න විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන.

10-749

එල්.ඩී.බී. 89/48.

**තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගමය**

(286 වැනි අධිකාරය වූ) තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගම් ආඥා පනතේ II වැනි වගන්තිය යටතේ තැපැල් හා විදුලි පණිවුඩ සුභසාධක සංගමය විසින් සම්පාදිත හා එම වගන්තිය මගින් තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඔහු විසින් ස්ථිර කරන ලද රීතිය.

අශෝක ජයසේකර,<br>
ලේකම්,<br>
තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය.

2010 සැප්තැම්බර් මස 28 වැනි දින,<br>
තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල,<br>
අංක 310, ඩී. ආර්. විජේවර්ධන මාවත,<br>
කොළඹ 10.

**රීති**

1949 ජනවාරි මස 07 වැනි දින අංක 9936 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ කලින් කල සංශෝධනය කරනු ලැබූ තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගමයේ රීති පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(01) I වැනි පරිච්ඡේදය - සාමාන්‍ය රීති

(i) II (1)(ආ) රීතියේ - "රුපියල් 10,000" යන වචන සහ ඉලක්කම් වෙනුවට රුපියල් 20,000 යන වචන හා ඉලක්කම් ආදේශ කරන්න.

(ii) 19(3)(1)වැනි රීතියේ - (අ),(ආ),(ඇ),(ඈ), සහ (ඉ) යන ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කරන්න.

"(අ) අවුරුදු දෙකකට වැඩි සහ අවුරුදු පහකට අඩු කාලයක් සංස්ථාවේ සාමාජිකයෙකු වී සිටි තැනැත්තෙකුට රුපියල් 5000 ක් ගෙවිය යුතුය ;

(ආ) අවුරුදු පහකට වැඩි සහ අවුරුදු පහළොවකට අඩු කාලයක් සංස්ථාවේ සාමාජිකයකු වී සිටි තැනැත්තෙකුට රුපියල් 15,000 ක් ගෙවිය යුතු ය;

(ඇ) අවුරුදු පහළොවකට වැඩි කාලයක් සංස්ථාවේ සාමාජිකයකු වී සිටි තැනැත්තෙකුට රුපියල් 25,000 ක් ගෙවිය යුතු ය."

(iii) 20 වැනි රීතිය - (3) වැනි ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

"(3) (අ) ණය මුදල ප්‍රදානය කල මාසයට පසුව එළඹෙන මාසයේ සිට එම ණය මුදල ආපසු ගෙවීම ආරම්භ විය යුතු ය;

(ආ) සංස්ථාව විසින් ප්‍රදානය කරන ලද යම් ණය මුදලක් සඳහා සාමාජිකයාගෙන් රු.20 ක සේවා ගාස්තුවක් අයකල යුතු අතර, එම

සේවා ගාස්තුව ණය මුදල ආපසු ගෙවීමේ පළමු වාරිකයත් සමග අය කර ගත යුතු ය."

(2) II පරිච්ඡෙදය - සංස්ථාවේ අරමුදල් නිවාස දේපළ ණය සඳහා ආයෝජනය කිරීම.

10 වැනි රීතිය ඉවත් කර පහත දැක්වෙන රීතිය ආදේශ කරන්න :-

"පොළී අනුපාතය හා ගෙවිය යුතු දිනය"

10. (i) ණය මුදල ප්‍රදානය කල මාසයට පසුව එළඹෙන මාසයෙන් ආරම්භ වී එම ණය මුදලේ වාරික මුදල් මාසිකව ගෙවනු ලැබිය යුතු ය;

(ii) එක් එක් මාසය අවසානයේ දී හිඟ තබා ඇති මුදල මත (ශේෂය අඩු කිරීමේ පදනම මත) සෑම රුපියල් 100 කටම හෝ ඉන් කොටසක් සඳහා රුපියල් 1ක පොළියක් සාමාජිකයන්ගෙන් අය කරනු ලැබිය යුතු ය.

(3) III වන පරිච්ඡෙදය-විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ;

2 වැනි රීතිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කරන්න:-

"2 සංස්ථාවේ සෑම සාමාජිකයෙකුම අවම වශයෙන් මසකට රුපියල් 100ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතු ය. තම දායක මුදල වැඩි කිරීමට යම් සාමාජිකයෙකුට අවශ්‍ය නම් එසේ කළ හැකි අතර එකී වැඩිපුර ගෙවන වාරිකය රුපියල් 100 ගුණිතයන්ගෙන් ගෙවිය යුතු ය."

(4) VI වැනි පරිච්ඡෙදය - සාමාජිකයන්ගේ යැපෙන්නන් සඳහා මරණාධාර යෝජනා ක්‍රමය.

(i) III වැනි රීතිය-"(රුපියල් 6) රුපියල් හය" යන වචන සහ ඉලක්කම් ඉවත් කොට ඒ වෙනුවට "(රුපියල් 30) රුපියල් තිහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කරන්න;"

(ii) IV වැනි රීතිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කරන්න:-

"(IV) මරණාධාර යෝජනා ක්‍රමය යටතේ පහත දැක්වෙන පරිත්‍යාග කරනු ලැබිය යුතු ය ;

(අ) සාමාජිකයකුගේ කළත්‍රයා (ස්වාමි පුරුෂයා හෝ භාර්යාව) මිය යාමේදී - රු. 10,000

(ආ) සාමාජිකයකුගේ අවිවාහක පුතෙකු හෝ දියණියක මිය යාමේ දී - රු. 5000

(ඇ) සාමාජිකයකුගේ පියා හෝ මව මිය යාමේදී - රු. 3000

(5) VIIවැනි පරිච්ඡෙදය - විශේෂ අයිතමයන් මිලදී ගැනීම සඳහා ණය

(i) (i) රීතිය - රුපියල් 20,000 යන වචනය සහ ඉලක්කම් වෙනුවට රුපියල් 50,000 යන වචන සහ ඉලක්කම් ආදේශ කරන්න.

(ii) 4 රීතිය - (ඉ) ඡෙදය ඉවත් කොට පහත දැක්වෙන ඡෙදය ආදේශ කරන්න ;

"(ඉ) එකී ණය මුදල මාසික වාරික 50කින් අයකර ගත යුතුය. එක් එක් මාසය අවසානයේ දී හිඟ තබා ඇති මුදල මත (ශේෂය අඩු කිරීමේ පදනම මත) සෑම රුපියල් 100 හෝ ඉන් කොටසක් සඳහා රු. 1ක පොළියක් සාමාජිකයාගෙන් අයකරනු ලැබිය යුතුය."

(6) XI පරිච්ඡෙදය ඉවත් කොට පහත දැක්වෙන පරිච්ඡෙදය ආදේශය කරන්න ;

XI පරිච්ඡෙදය

*සුභ සාධක අරමුදල*

(1) (අ) (මෙහි මින් මතු සුභසාධක අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන) තැපැල් හා විදුලි පණිවුඩ සුභ සාධක සංගමයේ "සුභ සාධක අරමුදල" නම් වූ අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය.

(ආ) සුභසාධක අරමුදලේ අරමුණු වනුයේ-

(i) පහ වසර ශිෂ්‍යත්වයෙන් සමත්වන සාමාජිකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

(ii) අ. පො. ස. (උ. පෙ.) විභාගය සාර්ථක ලෙස සමත් වන සාමාජිකයන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම

(iiii) පිළිකා, වකුගඩු රෝග, හෘද රෝගවලින් පෙලෙන සාමාජිකයන්ට මුදල් ආධාර ප්‍රදානය කිරීම.

(ඇ) සංස්ථාවේ සාමාජික මුදල් ගෙවා ඇති සෑම සාමාජිකයෙක්ම එනයින්ම සුභ සාධක අරමුදලේ සාමාජිකයකු වීමට සුදුසුකම් ලැබිය යුතුය.

(ඈ) එක් එක් සාමාජිකයා සුභ සාධක අරමුදලේ සාමාජික ගාස්තු ලෙස මසකට රුපියල් 10ක මුදලක් ගෙවිය යුතුය.

(ඉ) (ආ) ඡෙදය යටතේ ප්‍රදානය කළ යුතු මූල්‍ය ආධාර ප්‍රමාණය, (ඈ) ඡෙදයේ සඳහන් සාමාජික ගාස්තු සංස්ථාවේ මහ සභා රැස්වීමකදී ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මතයක් මගින් සංශෝධනය කරනු ලැබිය හැකිය.

(ඊ) මේ පරිච්ඡෙදයේ විධිවිධාන සලස්වා නොමැති යම් ආරවුලක් හෝ විසඳිය යුතු ප්‍රශ්ණයක් සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව විසින් ගනු ලබන යම් තීරණයක් අවසාන හා තීරණාත්මක විය යුතුය.

(2) පහ වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ;

(අ) පහ වසර ශිෂ්‍යත්වයෙන් ලබා ගත් උපරිම ලකුණුවල පදනම මත ශිෂ්‍යයන් විසි දෙනෙකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කළ යුතු ය.

(ආ) ලබා ගන්නා ලද ලකුණුවල සමතාව නිසා (අ) ඡෙදයේ සඳහන් සංඛ්‍යාව විසින් දෙනෙකු ඉක්මවා යන අවස්ථාවක, සමාන ලකුණු ලබාගත් ශිෂ්‍යයන් අතර කුසපත් ඇදීමෙන් එම තෝරා ගැනීම කළ යුතු ය.

(ඈ) මේ පරිච්ඡේදයේ (1)(ඉ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, එක් එක් ශිෂ්‍යත්ව ලාභීන්ට එක් වරක් පමණක් ගෙවන රු. 5,000ක මුදලක් ප්‍රදානය කළ යුතුය.

3. අ. පො. ස. (උසස් පෙළ) ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය :

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක පළමු වසරේ උපාධි අපේක්ෂකයන් වන තැනැත්තන් 10 දෙනෙකුට ශිෂ්‍යත්ව 10ක් ප්‍රදානය කළ යුතුය.

(ආ) එම ශිෂ්‍යයන් 10 දෙනා පහත දැක්වෙන ආකාරයට තෝරා ගත යුතුය. ගණිත සහ විද්‍යා අංශ වලින් එක් අංශයකින් ශිෂ්‍යයන් දෙදෙනකු බැගින් ද, කලා අංශයෙන් සහ වාණිජ අංශයෙන් ශිෂ්‍යයන් තිදෙනෙකු බැගින් ද විය යුතුය.

(ඇ) ජයග්‍රහකයින් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ලබා ගත් වැඩිම ලකුණු ලබා ගත් පදනම මත තෝරා ගත යුතුය.

(ඈ) මේ පරිච්ඡේදයේ (1) (ඉ) ඡේදයේ විධිවිධානවලට යටත්ව එක් එක් ශිෂ්‍යත්වලාභීන්ට එක් වරක් පමණක් ලැබෙන රු. 10,000ක මුදලක් ප්‍රදානය කළ යුතුය.

(4) පිළිකා, වකුගඩු රෝග හෝ හෘද රෝග සඳහා ශල්‍ය කර්මවලට භාජනය වී ඇති සාමාජිකයන්ට මූල්‍ය ආධාර :

(අ) මේ පරිච්ඡේදයේ (1)(ඉ) ඡේදයේ විධිවිධානවලට යටත්ව පිළිකා, වකුගඩු රෝග හෝ හෘද රෝගවලට ශල්‍ය කර්මයක් කර ඇති සාමාජිකයෙකුට එක් වරක් පමණක් ගෙවනු ලබන රු. 25,000ක මුදලක් ගෙවනු ලැබිය යුතුය.

(ආ) මේ සම්බන්ධයෙන් සංස්ථාව විසින් නියම කරනු ලබන වෛද්‍ය සහතික හා වෙනත් ලේඛන ගත සාක්ෂි සාමාජිකයා විසින් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) මේ ඡේදය යටතේ වූ මූල්‍ය ආධාර-

(i) ශල්‍ය කර්මය අවසන් කළ පසු ගෙවිය යුතුය.
(ii) යම් සාමාජිකයෙකුගේ ජීවිත කාලය තුළ දී එක් වරක් පමණක් ගෙවිය යුතුය.
(iii) රු. 4,00,000 වැඩියෙන් වියදම් වන ශල්‍ය කර්ම සඳහා පමණක් ගෙවිය යුතුය.
(iv) එක් වර්ෂයක් තුළ සාමාජිකයින් පස් දෙනෙකුට පමණක් ගෙවිය යුතුය.

10-651

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : එම්ටී/09/00098/එම්ජී1/050.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මාතර ප්‍රසිද්ධ නොතාරිස් වන එම්. කේ. කලුආරච්චි විසින් සහතික කරන ලද 2008.03.31 දින හා අංක 37 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මාතර පදිංචි මල්ලවරාජ සමරවික්‍රම පියදාස අබේසේකර සහ රණතුංග ආරච්චිගේ විනීතා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.06.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ දහනවදහස් පන්සිය හයයි ශත දහය (රු. 5,19,506.10)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 37 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තුන්සිය දහතුනයි ශත දහතුන (රු. 313.13) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර මහ නගර සභා සීමාව තුළ වේරගම්පිට ග්‍රාමයේ, 5 වැනි හරස් පාර, වරිපනම් අංක 21හි පිහිටි හොටකළුගෙවත්ත නමැති ඉඩම, බලයලත් මිනින්දෝරු කේ. සිරිවර්ධන විසින් මැන සාදන ලද 1992.07.24 දිනැති හා අංක 159/1992 දරන මිණුම් පිඹුරේ (1995.03.01 දිනැති අතිරේක පිඹුරු අංක 61/1995) කැබලි අංක 8 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 9.17ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 520/3 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2010 ඔක්තෝබර් මස 07 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 03.

10-791/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : 6/49398/ඒ6/264.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.15 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් වන එච්. ඒ. කරුණාසේන විසින් සහතික කරන ලද 2006.12.28 දින හා අංක 5359 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි දොන් උපාලි අජිත් වික්‍රමසිංහ රාජපක්ෂ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.05.28 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ තිස්දහස් අටසිය පහළොවයි ශත හතළිහ (රු. 3,30,815.40)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 5359 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැටයි ශත අසූ අට (රු. 160.88) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර ඩයස් ගොඩනැගිල්ලහි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර කළුතර බැද්ද, කළුතර ප්‍රාදේශීය සභාවේ, නාගොඩ උප කාර්යාල සීමාව තුළ උග්ගල්ගොඩ පිහිටි එදිරිකැලේවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එච්. පී. ද එස්. තබ්‍රෘ විසින් සකසන ලද 2006.03.10 දිනැති හා අංක 1729 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 17 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10.60ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ජී 218/263 යටතේ ලියාපදිංචි වී ඇත.

තව ද එකී අංක 1729 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 26 (අඩි 20 පළල වෙන්කළ පාර) මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්. එම්. දයාසිංහ,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2010 ඔක්තෝබර් මස 07 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 03.

10-791/3

---

### මහජන බැංකුව - හපුතලේ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.29 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ නමට බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර යන අය විසින් 1998.04.23 වැනි දින ලියා සහතික කරන ලද අංක 497 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු ගෙවීම් කිරීම සුහසිංහ ජයරත්නගේ විජයානන්ද පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කර අංක 497 මත දැනට රුපියල් දෙලක්ෂ විසිහයදහස් හාරසිය හතලිස් එකයි ශත තුනක (රු. 2,26,441.03) මුදලක් එකී මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් එකී රුපියල් දෙලක්ෂ විසිහයදහස් හාරසිය හතලිස් එකයි ශත තුනක (රු. 2,26,441.03) මුදල ද, සමග රුපියල් දෙලක්ෂ විසිහයදහස් හාරසිය හතලිස් එකයි ශත තුනක (රු. 2,26,441.03) එකී මුදල මත 2007.08.31 සිට 2007.09.30 දක්වා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් හා 2007.10.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසිහතක් (27%) බැගින් තවදුරටත් වූ පොළිය ද ඒ සමග එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගත යුතු මුදල් හා ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු එකී මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක යන අය විසින් එකී අංක 497 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහ පළාත කෝරළේ, මැදිකිඳ කොට්ඨාසයේ හපුතලේ නගර සභා සීමාව තුළ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. මුණසිංහ යන අය විසින් සකස් කළ 1982.11.17 දිනැති අංක 1629 දරන පිඹුරෙහි කැබලි අංක 1 යනුවෙන් නිරූපණය කර බෙදා වෙන්කර නිර්ණය කරන ලද "කඩවතපතන" යනුවෙන් හඳුන්වනු ලබන එකී කැබලි අංක 1 ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරු අංක 1629හි කැබලි අංක 2 (පොදු ප්‍රවේශ මාර්ගය), නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : මාර්ගය දිගේ වූ රක්ෂිතය, බස්නාහිරට : T. P. 174920 වූ රජයේ පාසලට අයත් ඉඩම යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් පහළොවයි දශම දෙකක (අ. 0, රූ. 2, පර්. 15.2) වපසරියක් ඇති ඉඩම් කොටස සහ එකී පිඹුරු අංක 1629යේ කැබලි අංක 2 යනුවෙන් සළකුණු කළ ඉඩම මතින් වූ මාර්ග අයිතිය ද සහිතව එකී බෙදා වෙන් කර නිර්ණය කරන ලද ඉඩම් කොටස බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක J75/195 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
ඌව කලාපය.

මහජන බැංකුව,
ඌව කලාප කාර්යාලය,
බදුල්ල.

10-783

**සෙලාන් බැංකුව පීඑල්සී - පියස සෙන්ටර් ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 මැයි මස 21 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0430-09314460-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. කන්නන්ගර විසින් සහතික කරන ලද 2006 සැප්තැම්බර් මස 25 දිනැති අංක 19 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම පිළියන්දල පදිංචි අර්නෝලිස් කංකානම්ගේ ආනන්ද යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නවලක්ෂ හතලිස්පන් දහස් තුන්සිය දහනවයයි ශත අසූහතක (රු. 9,45,319.87) මුදලක්, 2009 ඔක්තෝබර් මස 26 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 9,45,319.87 මුදල ද, 2009 ඔක්තෝබර් මස 27 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 19 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඩාමඩුව පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2001.09.10 දිනැති අංක 1174 දරන සැලැස්මේ සඳහන් දික්හේනේකනත්ත හෙවත් දික්හේන එස්ටේට් නමැති ඉඩමේ ලොට් 94 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : අංක 560 දරන සැලැස්මේ සඳහන් ලොට් 98 සහ ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : අංක 1174 දරන සැලැස්මේ සඳහන් ලොට් 95 සහ බස්නාහිරට : අංක 560 දරන සැලැස්මේ සඳහන් ලොට් 98 ද යන මායිම් තුළ පෙර කී අංක 1174 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම හතරයි බිංදුවක් (අ. 0. රූ. 0, පර්. 13.40) විශාල ඉඩම.

එකී ලොට් 94 පහත විස්තර කරනු ලබන එකතුකළ ඉඩම් කොටස්වලින් බෙදා වෙන් කර ඇති අතර ලියාපදිංචිය ඒ හා සම්බන්ධවනු ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, කුඩාමඩුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2001 අගෝස්තු මස 27 වැනි දිනැති අංක 1164 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දික්හේන එස්ටේට් හෙවත් දික්හේනේකනත්ත නමැති ඉඩමේ ලොට් 5 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (ප්‍රාදේශීය සභා) ද, නැගෙනහිරට : පාර (පී. එස්.) සහ අංක 560 දරන සැලැස්මේ සඳහන් ලොට් 98 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 4 සහ බස්නාහිරට : අංක 560 දරන සැලැස්මේ සඳහන් ලොට් 96 ද යන මායිම් තුළ එකී අංක 1164 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.40) නොහොත් හෙක්ටයාර් 0.03389 ක් විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 153/192හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, කුඩාමඩුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2001 අගෝස්තු මස 27 වැනි දිනැති අංක 1164 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දික්හේන එස්ටේට් හෙවත් දික්හේනේකනත්ත නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 3 සහ අංක 560 දරන සැලැස්මේ ලොට් 31, 32, 95, 96 සහ 98 සහ මෙම ඉඩමේ ලොට් 5 ද, නැගෙනහිරට : රෝහණ විජේසේකර සහ තවත් අයගේ දේපළ ද, දකුණට : ඇල සහ බස්නාහිරට : ඇල ද යන මායිම් තුළ එකී අංක 1164 දරන සැලැස්ම අනුව අක්කර තුනයි පර්චස් විස්සක් (අ. 3, රූ. 0, පර්. 20) නොහොත් හෙක්ටයාර් 1.26465ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 233/20 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, කුඩාමඩුව ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. පී. රණසිංහ විසින් සාදන ලද 2001 අගෝස්තු මස 27 වැනි දිනැති අංක 1164 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දික්හේන එස්ටේට් හෙවත් දික්හේනේකනත්ත නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දික්හේනකනත්ත අංක 374 දරන සැලැස්මේ ලොට් 1සී හි ඉතිරි කොටස සහ මෙම ඉඩමේ ලොට් 2 ද, නැගෙනහිරට : අංක 560 දරන සැලැස්මේ සඳහන් ලොට් 23, 24, 25, 26, 27, 28, 29, 30, 31 සහ 32 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 4 සහ බස්නාහිරට : ඇල ද යන මායිම් තුළ එකී අංක 1164 දරන සැලැස්ම අනුව අක්කර පහයි පර්චස් දහයක් (අ. 5, රූ. 0, පර්. 10) නොහොත් හෙක්ටයාර් 2.04872ක් විශාල ගස් වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 233/268 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-826/1

---

**මහජන බැංකුව - මොරටුව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී

පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද අංක 7977 සහ 2008.10.24 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම සන්ලින් ගාර්මන්ට් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සරත් පතිරගේ මහතා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 7977 දරන බැඳුම්කරය මත රුපියල් එක්කෝටි නවලක්ෂ හතලිස් හත් දහස හාරසිය පනස් හතයි ශත අසූ පහක (රු. 1,09,47,457.85) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරි ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් එක්කෝටි නවලක්ෂ හතලිස් හත් දහස් හාරසිය පනස් හතයි ශත අසූපහක (රු. 1,09,47,457.85) එකී මුදල ද, 2010.02.03 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් එක්කෝටි නවලක්ෂ හතලිස් හත දහස් හාරසිය පනස් හතයි ශත අසූපහක (රු. 1,09,47,457.85) මුදලක් මත වර්ෂයකට සියයට (26%) බැගින් තවදුරටත් පොලිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 7977 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ජාලිගොඩ පිහිටියා වූ ද, පිළියන්දල ජාලිගොඩ, වරිපනම් අංක 69 (කලින් අංකය 43) දරන "ශ්‍රී රම්‍යා" නමින් හැඳින්වෙන මාදන්ගහවත්ත සහ කිරිපැල්ලගහවත්ත යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. පී. අබේනායක විසින් සාදන ලද අංක 2418 සහ 1997.06.21 වැනි දින දරන පිඹුරේ ලොට් E1 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් E2 දරන කොටස ද, දකුණට : කේ. පී. ඩී. විමලාවතී හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : එෆ්. ඩී. පෙරේරා හිමිකම් කියන ඉඩම ද, මායිම් වන්නාවූ ද, එකී අංක 2418 දරන පිඹුරට අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත් ය.

ඉහත කී ජාලිගොඩ පිහිටියා වූ ද, "මාදන්ගහවත්ත" සහ කිරිපැල්ලගහවත්ත යයි කියනු ලබන ඉඩමේ ලොට් A (පාර සඳහා වෙන් කිරීම) ලෙස ලකුණු කර ඇත්තා වූ ද, එකී අංක 172 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 1.3) විශාල වූ ද, ඉඩම් කොටස මාර්ග ප්‍රවේශයක් ලෙස භාවිතා කිරීමේ අයිතිය ද මීට ඇතුළත් වේ.

නුගේගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2943/215 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

10-784

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - වෙන්නප්පුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රන්පතිදේවගේ සුසිල් ප්‍රේමරත්න.

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩෙන්සිල් ෆොන්සේකා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2004.10.08 දිනැති අංක 25309 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රන්පතිදේවගේ සුසිල් ප්‍රේමරත්න යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසිනමදහස් දෙසීය හැත්තෑහතයි ශත තිස්හතර (රු. 3,29,277.34) ක මුදලක් 2010.04.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින්, එකී රු. 3,29,277.34ක මුදලට 2010.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 25309 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, පිටිගල් කෝරළේ දකුණ, යටිකලන් පත්තුවේ, මහවැව පිහිටි "මුදියන්සේගේවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ආර්. එෆ්. එච්. ෆොන්සේකා විසින් ලියා සහතික කරන ලද 2003.12.12 දිනැති අංක 4478 දරන පිඹුරේ ලොට් අංක 01 ඉඩමට මායිම්, උතුරට : නොයෙල්ට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : එල්. පී. ජයසේන සහ විල්බට් ලියනගේට අයිති ඉඩමෙන් ද, දකුණට : අඩි 12ක් පළල පාරෙන් ද සහ බස්නාහිරට : අඩි 11 පළල පාරෙන් ද මායිම් වූ රූඩ් එක (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම සහ සියළු දේත් සමග මෙම ඉඩම K83/69 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-816/7

## මහජන බැංකුව - මහනුවර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ජී. ආර්. එම්. කේ. පාලමකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2008.03.17 වැනි දිනැති අංක 2958 දරන උකස්කරය මත ලබා ගන්නා ලද මුදල් සිදම්බරම් යෝගරාජා සහ සින්නපට්ටන් සිදම්බරම් යන අය විසින් ගෙවීම් පැහැර හරිනු ලැබ ඇති බැවින් ද, මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. විජේරත්න මහත්මිය විසින් 2009.05.05 වැනි දින සහ 2010.06.10 දින සහතික කරන ලද පිළිවෙලින් අංක 6178 සහ අංක 6570 දරන උකස්කරයන් ප්‍රකාර සිදම්බරම් යෝගරාජා සහ සින්නපට්ටන් සිදම්බරම් යන අයගෙන් මහජන බැංකුව වෙත අයවිය යුතුව ඇති බැවින් ද, අංක 2958 යටතේ රුපියල් විසිඑක් ලක්ෂ පහළොස් දහස් නවසිය අනූහතයි ශත තුනක් (රු. 21,15,997.03) ද පිළිවෙලින් අංක 6178 සහ 6570 යටතේ රුපියල් හතළිස් ලක්ෂයක් (රු. 40,00,000) සහ රුපියල් අසූහතර ලක්ෂ තිස්එක් දහස් තුන්සිය පනස් හතයි ශත දොළහක (රු. 84,31,357.12) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, එකී රුපියල් විසිඑක් ලක්ෂ පහළොස් දහස් නවසිය අනූහතයි ශත තුනක (රු. 21,15,997.13) මුදලක් සඳහා 2010.04.24 වැනි දින සිට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් ද, රුපියල් හතළිස් ලක්ෂයක (රු. 40,00,000) මුදලක් සඳහා 2010.07.01 දින සිට වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් ද, රුපියල් අසූහතර ලක්ෂ තිස් එක් දහස් තුන්සිය පනස් හතයි ශත දොළහක (රු. 84,31,357.12) මුදලක් සඳහා 2010.07.01 වැනි දින සිට වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් වෙන්දේසි දිනය තෙක් පොලිය සහ අදාල මහජන බැංකු පනත යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග (අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව) අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 2958, 6178 හා 6570 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පේරාදෙණිය පාරේ දැනට සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, වරිපනම් අංක 215 සහ දැනට වරිපනම් අංක 399 දරන බලයලත් මිනින්දෝරු ඩබ්. කේ. එම්. එම්. වැලිවිට විසින් පිළියෙල කරන ලද අංක 231 හා 1975.02.11 දින දරන පිඹුරේ කැබලි අංක 03 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ හා නිරූපිත වපසරිය පර්චස් හතරයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 4.80) වූ ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : එකී පිඹුරේ කැබලි අංක 02 ද, නැගෙනහිරට : ගව ගාතකාගාරයේ සිට මහනුවර දක්වා වූ මහා මාර්ගය ද, දකුණට : වරිපනම් අංක 401 දරන පරිශ්‍රය ද, බටහිරට : පේරාදෙණිය සිට මහනුවර දක්වා වූ මහා මාර්ගය ද යන මායිම් තුළ භූමිය සමග ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 361/203 දරන පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. ඒ. බී. සිල්වා,
ප්‍රාදේශීය කළමනාකාර-මහනුවර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

10-778

---

## සෙලාන් බැංකුව පීඑල්සී - පියස සෙන්ටර් ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 අගෝස්තු මස 09 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 9952-01976049-540.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. එන්. ඩී. වැලිඅංග විසින් සහතික කරන ලද 2005 සැප්තැම්බර් මස 27 දිනැති අංක 363 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම වත්තල පදිංචි බැසිල් තවරාසා සහ මුරුගවල්මනි සුකිර්තවනී හෙවත් සුකිර්තවනී බැසිල් යන අය බන්ධනදායී/උකස්කරුවන් වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටතුන්ලක්ෂ හැත්තෑදහස් හයසිය අනූහතරයි ශත තිහක (රු. 63,70,694.30) මුදලක්, 2010 ජනවාරි මස 25 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 63,70,694.30 මුදලද, 2010 ජනවාරි මස 26 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 363 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල බලයලත් වෙන්දේසිකාර පී. මුතුකුමාරණ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඳාන තෙරේසා මාවත පිහිටි බලයලත් මිනින්දෝරු හියු. ආර්. සමරසිංහ විසින් සාදන ලද 1995 ජනවාරි මස 25 වැනි දිනැති අංක 2144 දරන සැලැස්මේ සඳහන් කෝන්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : කැලෙක්ස්ටා දෙහිවලගේ ඉඩම ද, නැගෙනහිරට : එච්. ඒ. පෝල් සහ මාලන් රණසිංහගේ ඉඩම ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : අඩි 12ක් පළල පාර යන මායිම් තුළ පර්චස් දොළහයි දශම හතරයි නවයක් (අ. 0, රූ. 0, පර්. 12.49) ක් විශාල ඉඩම.

මාර්ග අයිතිය :

පෙර කී අංක 2144 දරන සැලැස්මේ සඳහන් එකී ලොට් 1ට තෙරේසා මාවතේ සිට යන අඩි 12ක පාර උඩින් මාර්ග අයිතිය සමග.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-826/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නුගේගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රවීන්ද්‍ර සෙනරත් විජේසිංහ.
(කේ ඇන්ඩ් ආර් ෆොටෝ සර්විස් යන නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන).

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2005.12.30 දින අංක 1565 සහ 2006.07.14 දින අංක 2225 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහකික කරන ලද්දාවූ ද හැටන් නැෂන් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2007.09.25 දින අංක 2965 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී නමට ලියන ලද්දා වූ ද 2008.08.19 දින අංක 3239 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කේ ඇන්ඩ් ආර් ෆොටෝ සර්විස් යන නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන රවීන්ද්‍ර සෙනරත් විජේසිංහ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හැත්තෑඅට ලක්ෂ හැත්තෑහය දහස් තුන්සිය දහඅටයි ශත අනූ හයක් (රු. 78,76,318.96) ක මුදලක් 2010.08.09 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 78,76,318.96 ක මුදලට 2010.08.10 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1565, 2225, 2965 සහ 3239 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ මිරිහාන ගමෙහි පිහිටි විජිතාරාම පාර, වරිපනම් අංක 33 දරන "ගල්කණුඅම්බලම්වත්ත" නමැති ඉඩමට බලයලත් මානක කේ. එන්. ඒ. අල්විස් විසින් මැන සාදන ලද අංක 1854 සහ 2005 අප්‍රේල් මස 30 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 2න් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : ලොට් 4න් ද සහ බස්නාහිරට : නාගරික සංවර්ධන අධිකාරියෙන් ද මායිම් වූ අංක 1854 දරන පිඹුර ප්‍රකාර වූ පර්චස් දහතුනයි දශම හතයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 13.70)ක් විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-816/6

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - නුගේගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රවීන්ද්‍ර සෙනරත් විජේසිංහ.
(කේ ඇන්ඩ් ආර් ෆොටෝ සර්විස් යන නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන).

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන

ලද්දාවූ ද 2008.08.19 වැනි දින අංක 3238 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම (කේ ඇන්ඩ් ආර් ෆොටෝ සර්විස් යන නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන රවීන්ද්‍ර සෙනරත් විජේසිංහ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහඅටලක්ෂ හතලිස්නම දහස් එකසිය හතලිස් අටයි ශත තුනක (රු. 18,49,148.03) මුදලක් 2010.08.09 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 18,49,148.03ක මුදලට 2010.08.10 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3238 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

| *අයිතම අංකය* | *විස්තරය* | *මොඩ්ල් අංකය* | *සීරියල් අංකය* |
|---|---|---|---|
| 1 | ඩිජිටල් ප්‍රින්ටින් මැෂින්<br>නොරිට්සු වී 50 ෆිල්ම් ප්‍රොසෙසර්<br>ප්‍රින්ට් සයිස්, පී. සී. (3ආර්) සිට 12"x18"<br>(ඩිජිටල් සහ ඇනලොන් ප්‍රින්ටිං මාධ්‍ය)<br>පිටපත ඉංග්‍රීසි නව 2007<br>නිෂ්පාදිත වර්ගය : සැප්තැම්බර් 2002<br><br>සී. ඩී. සංයුක්ත තැටියේ අත්පොත<br>3 සියළුම මෘදුකාංග සංයුක්ත තැටි, සලාරා<br>1 135 ඔටෝ නෙගටිව් කැරියර්<br>1 චේංජින් බෑග්<br>5 ඒ. පී. එස්. ලෝඩින්ග් කැසට්<br>1 වතුර ජෝගුව<br>1 පුලර් ටේප් මැෂින්<br>1 ටිවින් චෙක්ස් මැෂින්<br>1 ස්පිලිසින් ටේප් මැෂින් | නොරිට්සු කිව්.<br>එස්. එස්. 2901 | 19901513 |

ණයකරු සහ/හෝ තනි පුද්ගල අයිතිකරු සතු (මෙහි මින්මතුවට සාමුහිකව බන්ධනදායීම සහ හෝ එකී තනි පුද්ගල ව්‍යාපාරයට හිමි චංචල යන්ත්‍ර සූත්‍ර ලෙස හඳුන්වනු ලබන) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ, ගංගොඩවිල ශ්‍රී සෝරත මාවත, අංක 18ඒ දරන පරිශ්‍රයේ සවිකර ඇති සියලුම උපාංග සහ ණයකරු සහ/හෝ තනි පුද්ගල අයිතිකරු සතු ඉහත කී දිස්ත්‍රික්කය තුළ කවර හෝ වෙනත් පරිශ්‍රයක කවර හෝ අවස්ථාවක පිහිටි චංචල යන්ත්‍ර සූත්‍ර සහ උපාංග මෙම බැඳුම්කරය ඇති කාලය තුළ හෝ ඊට සම්බන්ධ කාලය තුළ සහ/හෝ ඉන් ඉවත් කළ සහ/හෝ ගෙන ගිය චංචල යන්ත්‍ර සූත්‍ර සහ උපාංග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-816/5

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මොණරාගල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රාජපක්ෂ කරුණාවන්ත දේවයාලගේ පියසීලි.

2010.07.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් මල්වත්තගේ සෙලින් ජයරත්න පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.09.05 දිනැති සහ අංක 15323 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජපක්ෂ කරුණාවන්ත දේවයාලගේ පියසීලි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හාරදහස් හයසිය හතලිස් හතයි ශත හතලිස්හත (රු. 2,04,647.47) ක මුදලක් 2010.02.28 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,04,647.47ක මුදලට 2010.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 15323 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වෙල්ලස්ස කොට්ඨාසයෙහි, මැදගම්පත්තු කෝරළේ, දාගොනිය ගමෙහි පිහිටි (කොටමුදුනගෙදරවත්ත) නමැති ඉඩමට බලයලත් මානක පී. ඩබ්. නන්දසේන විසින් මැන සාදන ලද අංක එම්. ඕ/4435 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ආර්. කේ. ඩී. සිසිර කුමාර හිමිකම් කියන ඉඩමෙන් ද සහ අඩි 10ක් පළලැති පිවිසුම් මාර්ගයෙන් ද, නැගෙනහිරට : ආර්. කේ. ඩී. සරත් කුමාර සහ ආර්. කේ. ඩී. චන්ද්‍රදාස හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : ඩී. ඒ. හෙන්රි ඩයස් හිමිකම් කියන ඉඩමෙන් ද සහ බස්නාහිරට : ආර්. කේ. ඩී. ජයසුන්දර හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ පර්චස් පහළොවයි දශම අට (අ. 0, රූ. 0, පර්. 15.8) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි බිංදුව (හෙක්. 0.040) ක් විශාල ඉඩම තුළ ඇති සියළුම දේත් සමග මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 85/47 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-816/4

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බුත්තල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මාතාවර්ණ ආරච්චිගේ කුමාරදාස සහ රත්නායක මුදියන්සේලාගේ සුනිල්.

2010.07.29 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2004.09.01 දිනැති සහ අංක 12649 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාතාවර්ණ ආරච්චිගේ කුමාරදාස සහ රත්නායක මුදියන්සේලාගේ සුනිල් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස්අටදහස් හාරසිය දාසයයි ශත හැටහතර (රු. 1,38,416.64) ක මුදලක් 2010.06.28 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,38,416.64ක මුදලට 2010.06.29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 12649 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල කෝරළේ, මහගොඩයාය ග්‍රාම නිලධාරී කොට්ටාසයේ, මහගොඩයායගම නමැති ඉඩමට සර්වේ ජනරාල් විසින් මැන සාදන ලද අංක 14 දරන පිඹුරේ ලොට් 5සී නමැති ඉඩමට මායිම් වන උතුරට : ලොට් 14 1/2න් ද, නැගෙනහිරට : පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද, දකුණට : ලොට් 16න් සහ වන සංරක්ෂිතයෙන් සහ බස්නාහිරට : ලොට් 15න් සහ ලොට් 14 1/2න් ද මායිම්ව හෙක්ටයාර් එකයි දශම බින්දුවයි එකයි බින්දුව (හෙක්. 1.010)ක් විශාල ඉඩම සමග වේ. මෙය මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් ඩී ඕ 15/70 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-816/3

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරලැස්ගමුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

දන්දුන්නගේ තිලිණ පියමාල්.

2010.08.27 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.12.23 අංක 4725 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දන්දුන්නගේ තිලිණ පියමාල් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්එක්ලක්ෂ දෙදහස් තුන්සිය පනස්හතයි ශත විසිහතර (රු. 31,02,357.24) ක මුදලක් 2010.04.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 31,02,357.24ක මුදලට 2009.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4725 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ සිද්ධමුල්ලහි පිහිටි "ඇටඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩී. ඩබ්. අබේසිංහ විසින් මැන සාදන ලද අංක 1995/01/27 සහ අංක 4896 (වඩාත් නිවැරදිව අංක 4869) දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 1සී " ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1බී වලින් ද, නැගෙනහිරට : ලොට් 1ඩී වලින් ද, දකුණට : අත්තනායකගේ විලියම් අල්විස් සහ අනෙක් අය හිමිකම් කියන පිඹුරු අංක 2653ට අයත් ලොට් 1ඒ දරන ඇටඹගහවත්තෙන් ද සහ බස්නාහිරට : වී. සී. පාරෙන් ද මායිම් වූ එකී අංක 4869 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතරයි දශම අටයි හතයි පහ (අ. 0, රූ. 0, පර්. 14.875) ක විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 419/146 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-816/1

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරලැස්ගමුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

රත්න ලංකා ජයනිල ප්‍රොපටි සේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2010.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.07.16 දිනැති සහ අංක 2181 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රත්න ලංකා ජයනිල ප්‍රොපටි සේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්ලක්ෂ හැටදෙදහස් අටසිය හැටඅටයි ශත හැත්තෑතුන (රු. 50,62,868.73) ක මුදලක් 2009.07.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 50,62,868.73ක මුදලට 2009.08.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2181 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ බොරලැස්ගමුව හි පිහිටි කැස්බෑව පාර, වරිපනම් අංක 168 දරන "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක සී. එච්. ජී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 3405 සහ 1988 පෙබරවාරි මස 26 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 3බී ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : හෙන්රි වනිගසේකර හිමිකම් කියන වරිපනම් අංක 166 දරන දේපළෙන් ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 4න් ද, දකුණට : ලොට් 5 (අඩි 15ක් පළලැති පාරට වෙන් කරන ලද) න් ද සහ එම ඉඩමේම ලොට් 3ඒ වලින් ද සහ බස්නාහිරට : එම ඉඩමේම ලොට් 3ඒ වලින් ද මායිම් වූ අංක 3405 දරන පිඹුර ප්‍රකාර වූ පර්චස් එකොළයි දශම හයයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 11.60) ක විශාල ඉඩම් කොටස දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2843/237 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම බලයලත් මානක ජී. බී. දොඩන්වෙල විසින් 2002.03.30 දින සහ අංක 3887 දරන පිඹුර නැවත මැනීමකට ලක් කිරීමෙන් අනතුරුව මෙසේ විස්තර වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, බොරලැස්ගමුව නගර සභා සීමාව තුළ බොරලැස්ගමුව හි පිහිටි කැස්බෑව පාර, වරිපනම් අංක 168 දරන "දෙල්ගහවත්ත" නමැති ඉඩමට අයත් පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : බොරලැස්ගමුව මහා විද්‍යාලයෙන් ද, නැගෙනහිරට : කැස්බෑව පාර වරිපනම් අංක 168ඒ දරන දේපලෙන් ද, දකුණට : අඩි 15ක් පළලැති පාර (බලයලත් මානක එස්. එච්. බර්නාඩ් ජෝසප් විසින් මැන සාදන පිඹුරු අංක සී/15/85ට අයත් ලොට් 5න් ද) සහ බස්නාහිරට : කැස්බෑව පාර, වරිපනම් අංක 168/1 දරන දේපලෙන් ද මායිම් වූ අංක 3887 දරන පිඹුර ප්‍රකාර වූ පර්චස් එකොලහයි දශම එකයි හත (අ. 0, රූ. 0. පර්. 11.17) ක විශාල ඉඩම් කොටස වේ.

ඉහත විස්තර කරන ලද පිඹුර උකස්කර අංක 2181ට අයත් දෙවන උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10-816/2

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 1309685801.
ණය ගිණුම් අංක : 196241, 196242 සහ 428172.

සිසිලියා ෆ්‍රාන්සස් ශිරානි කරුණාරත්න හෙවත් ජයකොඩි යන අය එලිජා සන්ජීව දමින්ද කරුණාරත්න සමග ඉකෝ පැක් ලංකා පේපර් කන්වර්ටර්ස් යන නාමය, විලාශය සහ ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරය

2009 දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා විසින් 2008 පෙබරවාරි 22 වැනි දින සහතික කරන ලද අංක 32062 සහ 32064 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වන ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉකෝ පැක් ලංකා පේපර් කන්වර්ටර්ස් යන නාමය, විලාසය, සහ ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන ව්‍යාපාරයේ හවුල්කරුවන් වන එලිජා සන්ජීව දමින්ද කරුණාරත්න සහ සිසිලියා ප්‍රැන්සිස් ශිරානි කරුණාරත්න හෙවත් ජයකොඩි යන අය ණයකරුවන් හැටියට ද, සිසිලියා ප්‍රැන්සිස් කරුණාරත්න හෙවත් ජයකොඩි යන අය උකස්කරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන හයක් සහ නම ලක්ෂ පනස් තුන් දහස් එකසිය තිස් අටක් සහ ශත හැත්තෑ තුනක (රු.6,953,138.73) මුදලක් 2009 ජූලි 20 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට අයවිය යුතුව සහ

ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හයක් සහ නම ලක්ෂ පනස් තුන් දහස් එකසිය තිස් අටක් සහ ශත හැත්තෑ තුනක මුදල (රු. 69,53,138.73) අයකර ගැනීම සඳහා 2009 ජූලි 21 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 5,46,235 ක මුදල මත 22% ක වැඩිදුර වාර්ෂික පොලියද, රුපියල් 5,74,235 ක මුදල මත 22% ක වැඩිදුර වාර්ෂික පොලිය ද, රුපියල් 5,74,995 ක මුදල මත 14% ක වැඩිදුර වාර්ෂික පොලිය ද සහ රුපියල් 45,00,000 ක මුදල මත 20% ක වැඩිදුර වාර්ෂික පොලිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 32062 සහ 32064 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ඩෝප් වීදියේ අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් 2001 ජුනි 18 වන දින සාදන ලද පිඹුරු අංක 2731 හි දැක්වෙන වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ මාරවිල ලියාපදිංචි කොට්ඨාසය තුල දකුණු පිටිගල් කෝරලේ මැද පළාතේ, සන්දනන්ගම, තබ්බෝව, දුන්කන්නාව හි පිහිටි සිට්ටාවන තොට්ටම් හෙවත් සිසිලියා එස්ටේට් නම් ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : නාත්තන්ඩිය උඩුබැද්දාව ප්‍රධාන පර ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර සහ ඉහත පිඹුරු අංක 2731 හි ලොට් 02 කොටස ද, දකුණට : එම සඳහන් කළ ලොට් 02 කොටස ද, බස්නාහිරට : ඒ. ඒ. මාසිලීන් අප්පුහාමිට අයිති ඉඩම ද, ගාමිනීට අයිති ඉඩම ද, බලයලත් මිනින්දෝරු වයි. එම්. රන්ජිත් යාපා විසින් 1989.12.08 දින සාදන ලද පිඹුරු අංක 790 හි දැක්වෙන ලොට් 23 සහ 25 යන කොටස් ද, පාර ද, සේනානායකට අයිති ජයකොඩිවත්ත යන ඉඩමද, ප්‍රියන්ත සහ අනෙක් අයට අයිති ඉඩම ද, නාදන් යන අයට අයිති ඉඩම ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 2731 ට අනුව අක්කර දහ අටක් සහ පර්චස් තිස්දෙකයි දශම පහක් විශාල ඉඩම (අ. 18, රූ. 0, පර්. 32.5) මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J127/91 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-768

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක PQ 116 දරන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

ණය ගිණුම් අංක : 336295.
හේවා හකුරු රත්නසිරි සහ හේවා හකුරු ජයරත්න.

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ජුනි මස 18 වන දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් සහ වර්තමානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 1094 සහ 2005 ජුනි මස 10 දින දරන බැඳුම්කරය සහ අංක 1818 සහ 2006 දෙසැම්බර් 13 දින දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් ඉහත කී හේවා හකුරු රත්නසිරි සහ හේවා හකුරු ජයරත්න යන අය බන්ධනදායීන් වශයෙන් සහ එකී හේවා හකුරු ජයරත්න යන අය උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති බැවින් ද, ඉහත කී බැඳුම්කර මත 2010 මැයි මස 25 වන දිනට රුපියල් අටලක්ෂ තිස්දෙදහස් එකසියදහතුනකුත් ශත පනස්අටක (රුපියල් 8,32,113.58) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත වර්තමානයේදී ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින්ද, ඉහත කී රුපියල් අටලක්ෂ තිස්දෙදහස් එකසියදහතුනකුත් ශත පනස්අටක (රුපියල් 8,32,113.58) මුදල සහ 2010 මැයි මස 26 වන දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් හයලක්ෂ පහළොස්දහස් නවසීයයක (රුපියල් 6,15,900) මුදල මත වර්ෂයකට 22% බැගින් පොළියද, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති යම් වෙනත් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1094 සහ 1818 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ 12 අළුත් කඩේ වීදියේ අංක 99 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු වන එල්.බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බටහිර වලල්ලාවිට කෝරලේ බෙන්තර කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 41A දරන හිපන්කන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දියපිටගල්ලෙන ගමේ පිහිටි ඉගල්පොත්ත නමැති ඉඩමට මිනුම්පති විසින් සහතික කරන ලද අංක GA/1928 සහ 1984 නොවැම්බර් මස 15 දින දරන මූලික පිඹුර ප්‍රකාර ලොට් 01 නමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : මෙම ඉඩමේම ලොට 2 සහ P. P. GA/1918 දරන පිඹුරේ ලොට් 9 ද, නැගෙනහිරට: මෙම ඉඩමේම ලොට් 2 සහ ලොට් 15 ද දකුණට : මෙම ඉඩමේම ලොට් 15 සහ ගම්සභා පාර ද, බස්නාහිරට : ගම්සභා පාර ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර බින්දුවයි දශම හතරයි බින්දුවයි හෙක්ටයාර් බින්දුවයි අටක් (හෙක්ටයාර 0.408) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමගය. මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO B 12/204 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

10-767

### මහජන බැංකුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.05.25 දින පවත්වන ලද රැස්වීමේ දී මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුව නමට, නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් ජයමිණි අඹගහවත්ත ලියා සහතික කළ අංක 619 හා 2007.05.17 දින ද, අංක 861 හා 2008.08.12 දිනද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, ජයදුනු රණතුංග ආරච්චිගේ රත්නසිරි රණතුංග යන අය විසින් පැහැර හැර ඇති හෙයින්ද, දැනට එකී උකස් බැඳුම්කරය මත රුපියල් හතලිස් දෙලක්ෂ හතලිස් පන් දහස් හයසිය හතරකුත් ශත දොළහක (රු.42,45,604.12) මුදලක් සහ රුපියල් හයලක්ෂ හතලිස් එක් දහස් පන්සිය විසි එකකුත් ශත හැට තුනක (රු. 6,41,521.63) මුදලක් මහජන බැංකුවට ලැබිය යුතුව හා අයවිය යුතුව තිබෙන හෙයින්ද 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ එකී අංක 619 හා අංක 861 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුව වෙත උකස් කර තිබෙන දේපල හා පරිශ්‍රය, එකී රුපියල් හතලිස් දෙලක්ෂ හතලිස් පන් දහස් හයසිය හතරකුත් ශත දොළහක (රු.42,45,604.12) මුදල සහ රුපියල් හයලක්ෂ හතලිස් එක් දහස් පන්සිය විසි එකකුත් ශත හැට තුනක (රු.6,41,521.63) මුදල සහ එකී රු. 42,45,604.12 ක මුදල සඳහා 2009.09.19 දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට විසිඑක (21%) බැගින් හා රු. 6,41,521.63 ක මුදල සඳහා 2009.03.19 දින සිට විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් වැඩිදුර පොලිය ද, ගාස්තු හා වෙනත් අයකිරීම් ද (ඒ වන විට වෙනත් යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකර) අයකර ගැනීම සඳහා කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 දරන ස්ථානයේ, බලයලත් වෙන්දේසිකාර, ශොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත පරිදි වූ 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභාවේ (උරුවල් පේරුව උප කාර්යාල බල ප්‍රදේශයේ) යොන්ගම්මුල්ලේ පිහිටි "ගල්බොඩවත්ත" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. නිහාල් විසින් මැන සකස් කළ අංක 1385 හා 2005.05.15 දින දරන (වඩා නිවැරදිව 2005.04.15 දින දරන) පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ලකුණු කල බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 04 ද, නැගෙනහිරට : ලොට් අංක 1 ද, දකුණට : ඩබ්ලිව්. එම්. පී. බී. විජේකෝන් හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට: ලොට් අංක 3 ද යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත් පර්චස් තිස් හතයි දශම හතක් (අ. 0, රූ. 2, පර්. 37.7) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E845/191 යටතේ ලියාපදිංචි වී තිබේ.

ඉහත සඳහන් ලොට් අංක 2 දරන බිම් කට්ටිය මෙහි පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන්කල බිම් කට්ටියක් වේ :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභාවේ (උරුවල් පේරුව උපකාර්යාල බල ප්‍රදේශයේ) යොන්ගම්මුල්ලේ පිහිටි "ගල්බොඩවත්ත" නමැති ඉඩමේ, අක්කර එකකුත් රූඩ් තුනක් (අ. 1, රූ. 3, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වන උතුරට : නිස්සංග සිංඤො අප්පුට සහ තවත් අයට අයිති කාණුව ද, නැගෙනහිරට : ජීලිස් අප්පුට සහ තවත් අයට අයිති කාණුව ද, දකුණට : දුනු අප්පුගේ හෙන්චි අප්පුට අයිති දකුණු පැත්තේ කොටස වෙන්වන පැළඉණි වැට ද, බස්නාහිරට : හිරන් අප්පුට සහ තවත් අයට අයිති කාණුව ද යන මායිම් ඇතුළත පිහිටි බිම් කට්ටිය සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E90/264 යටතේ ලියාපදිංචි වී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 40, උද්‍යාන පාර,
නුවරඑළිය.

10-779

---

### මහජන බැංකුව - මහනුවර ශාඛාව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. විජේරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2009.03.20 දිනැති අංක 6153 සහ 2009.07.15 දිනැති අංක 6214 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම් කිරීම, චම්පා සුදර්ශනී විජේසිංහ (ජා. හැ. අංක 698242400V) සහ සරත් කුමාර දූල්වල හෙවත් දූල්වල විදානෙලා ගෙදර සරත් කුමාර (ජා. හැ. අංක 573191358V) යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, පිළිවෙලින් අංක 6153 සහ 6214 යටතේ රුපියල් දහඅට ලක්ෂයක් (රු. 18,00,000) සහ රුපියල් එක් ලක්ෂ හැටහය දහස් හයසිය හැටහයකුත් ශත හැත්තෑවක (රු.1,66,666.70) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, රුපියල් දහඅට ලක්ෂයක් (රු. 18,00,000) මුදලක් සඳහා 2010.04.15 දින සිට වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ද, රුපියල් එක්ලක්ෂ හැට හය දහස් හයසිය හැටහයකුත් ශත හැත්තෑවක (රු. 1,66,666.70) මුදලක් සඳහා 2010.01.15 දින සිට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් වෙන්දේසි දිනය තෙක් පොලිය හා අදාල මහජන බැංකු පනත යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 6153 සහ 6214 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29L වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව කුළුගම්මන සිය පත්තුවේ පහළ දූල්වල පිහිටි අස්වැද්දුම කුඹුර හෙවත් වත්ත නමැති

ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. හීන්කෙන්ද මහතා විසින් මැන සාදන ලද 2006.01.14 දිනැති අංක 2808A දරන පිඹුරේ කැබලි අංක 01 වන (එකී මිනින්දෝරු තැනගේ 2003.05.14 දිනැති අංක 2808 දරන පිඹුරේ කැබලි අංක 02 හි උප බෙදුම) බෙදා වෙන් කල හා නිරූපිත වපසරිය පර්චස් විස්සයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 20.5) වූ ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : අංක 2808 පිඹුරේ කැබලි අංක 1 ද, නැගෙනහිරට : කැබලි අංක 01 හා 02 ලකුණු කළ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, ගන්නොරුව සිට බරිගම දක්වා පාර ද, දකුණට : අංක 2802 පිඹුරේ කැබලි අංක03 සහ 04, බටහිරට : අංක 2808 පිඹුරේ කැබලි අංක 03 ද, අංක 2808 පිඹුරේ කැබලි අංක 01 ද, යන මායිම් තුල භූමිය සමග ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේ වේ.

මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 778/178 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. ඒ. බී. සිල්වා,
ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

10-777

---

## මහජන බැංකුව - ඒරාවූර් ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ ගත් තීරණය

2010.05.25 වැනි දින පැවැත්වූ මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී 1986 අංක 32දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය අනුව, පහත සඳහන් තීරණය ඒකමතිකව ගන්නා ලද බව මෙයින් දැනුම් දෙමු.

මීරාසාහිබු අබ්දුල් අසීස් මහතා හා අබ්දුල් අසීස් මොහොමඩ් අස්මින් මහතා මහජන බැංකුව වෙනුවෙන් මඩකලපු දිස්ත්‍රික්ක නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් වන ටී. එන්. විජයකුමාර් මහත්මිය විසින් 2007.08.06 දින සහතික කරන ලද අංක 1005 දරන බැඳුම්කරය මත වූ මුදල් ප්‍රමාණය ගෙවීම් පැහැර හැර ඇති නිසාත්, එම බැඳුම්කරය මගින් දැනට මහජන බැංකුවට ගෙවිය යුතු මුදල නම් රුපියල් දෙලක්ෂ පනස් හය දහස් හයසිය හැත්තෑ දෙක (රු. 2,56,672) වන නිසාත්, මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ තමන්ට පවරන ලද බලය උපයෝගී කොට, සඳහන් කළ අංක 1005 දරන බැඳුම්කරය මගින් බැංකුවට උකස් කළ දේපල හා ඉඩම්, බලයලත් වෙන්දේසිකරු වන අලෙක්සාන්ඩර් එම්මානුවෙල් කිංස්ටන් දිසවීරසිංහ මහතා, අංක 08, මුදලියාර් පාර, මඩකලපුව විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා, එය මගින් සඳහන් කළ මුදල් ප්‍රමාණය වන රුපියල් දෙලක්ෂ පනස් හය දහස් හය සිය හැත්තෑ දෙක (රු. 2,56,672) මුදල ද, එමෙන්ම 2009.04.11 දින සිට විකුණන දිනය දක්වා රුපියල් දෙලක්ෂ පනස් හය දහස් හය සිය හැත්තෑ දෙක (රු. 2,56,672) මුදල් ප්‍රමාණය මත අවුරුද්දකට පොලිය 24.0% බැගින් ද, එම මහජන බැංකු පනතේ "29එල්" වගන්තිය යටතේ අය කළ යුතු වියදම් හා මුදල්ද, මීට අතරතුර කිසියම් මුදලක් ගෙවා ඇත්නම් එවැනි මුදල් අඩුකර, අයකර ගැනීමට මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

නැගෙනහිර පළාත, මඩකලපු දිස්ත්‍රික්ක, එරාවූර් පත්තු ඒරාවූර්හි පිහිටි "මුන්දිරියඩි වලවු" යනුවෙන් සඳහන් කරනු ලබන ඉඩම් කොටසෙන් බෙදා මායිම වෙන්කරනු ලැබූ උතුර දිශා පංගුවක්, ගොඩනැගිලි, ගස්, වතු, පොළොව හා එහි හටගන්නා සියලු දේ අඩංගුව, මායිම් විස්තර නම්, උතුරට : උමරු ලෙබ්බේ වන්නිමයි මීරා ලෙබ්බේගේ ඉඩම, දකුණට : ඒ. එම්. හුසෙයින්ගේ ඉඩම, නැගෙනහිරට : පාර, බටහිරට : ඒ. එල්. අබ්දුල් කරීම්, බිම් ප්‍රමාණය : උතුර සිට දකුණට අඩි 10 යි, නැගෙනහිරට සිට බටහිරට අඩි 42 යි. මෙම ඉඩම මඩකලපු ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වොලියුම්/ෆෝලියෝ අංක A140/134 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම නැවත සමීක්ෂණය කර, පහත සඳහන් පරිදි ද විස්තර කර ඇත :-

නැගෙනහිර පළාත, මඩකලපු දිස්ත්‍රික්ක එරාවූර් නගර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඒරාවූර් නගර ප්‍රාදේශීය සභා මායිම් තුළ ඒරාවූර් ගමේ කොට්ඨාස අංක 2, ඒරාවූර් 6ජ් කාදියාර් පාරේ පිහිටි හා බලයලත් මිනින්දෝරු සහ මටට්මිකරු වන ඒ. සිංහරාජා මහතා විසින් 2007.03.10 දින සාදන ලද අංක AS/07/ET/11[a] දරන පිඹුරේ විස්තර කරන ලද හා තක්සේරු අංකය 6 දරන "මුන්දිරියඩි වලවු" යනුවෙන් හැඳින්වෙන ඉඩම් කොටසක්. මායිම් විස්තර, උතුරට : එම්. සමීනාගේ හා අනුන්ගේ ඉඩම, නැගෙනහිරට : කාදියාර් පාර, දකුණට : එම්. ඒ. අසීස්ගේ ඉඩම, බටහිරට: එම්. ඒ. අසීස්ගේ ඉඩම, බිම් ප්‍රමාණය : පර්චස් එකයි දශම පහයි හතරක් (අ. 0, රූ. 0, පර්. 1.54)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
මඩකලපුව.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 25/1, කෝවින්දන් පාර,
මඩකලපුව.

10-780

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : කේයූ/18/860/එම්කේජ්/078.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.15 දින පැවැත්වුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. මෙන්ඩිස් විසින් සහතික කරන ලද 2006.07 24 දින හා අංක 10869 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම කු/බෝපිටිය පදිංචි සුරිය බණ්ඩාර මුදලිගේ කපිල සුරිය බණ්ඩාර හෙවත් සුරිය මුදලිගේ කපිල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.06.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හැත්තෑතුන් දහස් නවසිය අසූ තුනයි ශත විසි හත (රු. 2,73,983.27) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 10869 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට පොලිය රුපියල් එකසිය දොළහයි ශත හැට (රු. 112.60) ක් බැගින් වැඩිපුර පොළිය ද අය විය යුතුව ඇති හෙයින් ද (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න.)

මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවට උකස් කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වන වගන්තිය ප්‍රකාර කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුකහකෝරලේ දේවමැදි හත්පත්තුවේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුල තිබ්බටුවාව ග්‍රාමයේ පිහිටි තලයායඑස්ටේට් නැමති ඉඩම බලයලත් මිනින්දෝරු ජී. එස් ගලගෙදර විසින් සකසන ලද, 2005.03.27 දිනැති හා අංක 7632 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 2, පර්. 0 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේත් සමග වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 1080/278 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
වැඩබලන සාමාන්‍යාධිකාරී.

2010ක් වූ ඔක්තෝබර් මස 07 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

10-791/1

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය : පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 275199, 275191 සහ 275194
කේ. ආර්. බ්‍රදර්ස්

2008 ජූලි මස 10 වන දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් නිශ්චය කරන ලදි.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පී. ගනේපොල විසින් 2002 ජනවාරි මස 10 වැනි දින සහතික කරන ලද අංක 5590 සහ 2000 ජූලි මස 17 වන දින සාදන ලද අංක 4487 සහ 4489 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කේ. ආර්. බ්‍රදර්ස් යන නාමය සහ විලාශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොස්වත්තගෙදර රාජපක්ෂගේ ජයසේන සහ කොස්වත්තගෙදර රාජපක්ෂගේ සුනිල් ආනන්ද යන අය ණයකරුවන්/උකස්කරු හැටියට ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් මිලියන දෙකක් සහ හත්ලක්ෂ විසිහය දහස් දෙසිය දෙකක් (රු. 27,26,202) මුදලක් 2008 පෙබරවාරි මස 26 වැනි දින විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දෙකක් සහ හත්ලක්ෂ විසිහය දහස් දෙසිය දෙකක් (රු. 27,26,202) මුදල අයකර ගැනීම සඳහා 2008 පෙබරවාරි මස 27 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,90,000.00 ක මුදල මත 20% ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබා ගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී බැඳුම්කර අංක 4487, 4489 සහ 5590 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

අනුඥාලත් මිනින්දෝරු එස්. ඒ. වී. පෙරේරා විසින් 1984 අගෝස්තු මස 10 වන දින සාදන ලද අංක 95/84 දරන පිඹුරෙහි දැක්වෙන බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසය තුල අළුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ ගල්ඔළුව හි පිහිටි ඊරියගහකුඹුර කියන ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ එහි පිහිටි සියළුදේත් සමග බෙදා වෙන් කර ලොට් 2 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 1 ද, නැගෙනහිරට : එච්. එස්. ජයවර්ධනට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : ලොට් 3 සහ බස්නාහිරට : කොළඹ - මීනුවන්ගොඩ මහා මාර්ගය ද යන මායිම් තුල එකී පිඹුරු අංක 95/84 අනුව පර්චස් හතරයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 4.85) විශාල ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C672/378 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-770

### කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 1380010361.
ණය ගිණුම් අංකය : 390672.
ලංකා බෝයිසන් ඉලෙක්ට්‍රොනික් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

2010 ජුනි 18 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2007 ජූලි 06 වැනි දින සහතික කරන ලද අංක 824 දරන දැන් කොමර්ෂල් බැංක් ඔෆ් සිලොන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අංක 277,නව හුණුපිටිය පාර, දලුගම, කැලණිය නම් ලියාපදිංචි ලිපිනයෙහි, සමාගම් පනත යටතේ සංස්ථාපිත කළ ලංකා බෝයිසන් ඉලෙක්ට්‍රොනික් (ප්‍රයිවෙට්) ලිමිටඩ සමාගම ණයකරු හැටියට ද, නෙල්සන් නාගසිංහ යන අය උකස්කරු ලෙස ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන දහසයක් සහ හත් ලක්ෂ හැටපන් දහස් හත්සිය හැත්තෑ පහයි ශත තිස් අටක (රු. 1,67,65,775.38) මුදලක් 2010 මැයි මස 17 වැනි දින වන විට කොමර්ෂල් බැංක් ඔෆ් සිලොන් (පී.එල්.සී) හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දහසයක් සහ හත්ලක්ෂ හැටපන්දහස් හත්සිය හැත්තෑපහයි ශත තිස් අටක මුදල (රු. 1,67,65,775.38 ) අයකර ගැනීම සඳහා 2010 මැයි මස 18 වැනි දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 1,45,92,702.30 ක මුදල මත 22% ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් හා වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 824 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල සහ පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩොෆ් වීදියේ අංක 99 හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

#### උපලේඛනය

බලයලත් මිනින්දෝරු පී. ගාල්ලගේ විසින් 1985 මැයි 12 වැනි දින සාදන ලද පිඹුරු අංක 103 හි දැක්වෙන බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැලණිය දලුගම ඒකකයේ ප්‍රාදේශීය සභා සීමාවන් තුල දලුගම වේවැල්දූවේ අලුත් පාරේ වරිපනම් අංක 277 දරන මාරගහවත්ත කියන ඉඩමේ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කර ලොට් 3 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : දොන් චාර්ල්ස් පොන්නම්පෙරුම සහ අනෙක් අයගේ මාරගහවත්ත ඉඩම ද, නැගෙනහිරට : වැසි වතුර ගලා යන ස්වභාවික ඇල ද, දකුණට : හුණුපිටිය - සපුගස්කන්ද මාර්ගය ද, බස්නාහිරට : ලුම්බිනි පටු මඟ ද යන මායිම් තුල පෙර කී පිඹුරු අංක 103ට අනුව රූඩ් එකයි පර්චස් දහයයි දශම අටයි පහක් විශාල ඉඩම (අ. 0, රූ. 1, පර්. 10.85) කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C605/19 වෙළුම/පත්‍රිකාව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

10-769

---

### ලංකා බැංකුව - අධිශ්‍රේණි ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.09.23 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2005.08.01 දිනැති අංක 4055 දරන උකස්කරය මත මුල් මුදල (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් එක්ලක්ෂ තිස් නවදහස් හත්සිය පණස් හයයි ශත තිස්තුනක (රු. 1,39,756.33) මුදල බැහැර කොට) හා 2010.06.30 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් විසිලක්ෂ පනස් හතර දහස් අටසිය හැට දෙකයි ශත හතරක (රු. 20,54,862.04) මුදල සමග රුපියල් පහලොස් ලක්ෂයක (රු. 15,00,000) මුදල් මත (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් එක්ලක්ෂ තිස් නවදහස් හත්සිය පනස් හයයි ශත තිස්තුනක (රු. 1,39,756.33) මුදල බැහැර කොට) 2010.07.01 දින සිට ගෙවීම් නිම කරන දිනය තෙක් සියයට පහළොවක (15%) වාර්ෂික පොළියක් ද, මාතලේ, හුලන්ගමුව පාර, අංක 298 දරන ස්ථානයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ පුෂ්පා මහින්ද හේරත් මයා, දෝන ප්‍රියන්ත මානෙල් අතුකෝරළ මිය හා හේරත් මුදියන්සේලාගේ ගෙදර කුලරත්න මයා යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2005.08.01 දිනැති අංක 4055 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් විසිලක්ෂ පනස් හතර දහස් අටසිය හැට දෙකයි ශත හතරක (රු. 20,54,862.04) මුදල (2010.06.30 දින වන ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් එක්ලක්ෂ තිස් නවදහස් හත්සිය පණස් හයයි ශත තිස්තුනක (රු. 1,39,756.33) මුදල බැහැර කොට) සමග 2010.07.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු සහ මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ නගරයේ මාතලේ මහ නගර සභා සීමාව තුළ නාගොල්ල හි පිහිටි, මහවෙල බලයලත්

මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මයා විසින් සාදන ලද 1999 අගෝස්තු මස 22 වැනි දිනැති අංක 4293 දරන පිඹුරේ කැබලි 02 යනුවෙන් පෙන්නුම් කර ඇති වත්තේ ගෙදර වත්ත යයි හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන ඉහත කී අංක 4293 දරන පිඹුර අනුව වයඹදෙසට : ඉහත කී පිඹුරේ කැබලි 1 ද, නැගෙනහිරට : හුලන්ගමුව සිට කුඹියන්ගොඩට යන මහ පාර ද, ගිණිකොණදෙසට : ඉහත කී අංක 4293 දරන පිඹුරේ කැබලි 5 යනුවෙන් පෙන්නුම් කර ඇති අඩි 12ක පළලැති මාර්ග ප්‍රවේශය ද, නිරිතදෙසට : ඉහත කී අංක 4293 දරන පිඹුරේ කැබලි 3 ද, මායිම් වූ පර්චස් විසිහතයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 27.5) වපසරියෙන් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සියල්ල එහි තුළ ඇති වගාවන් සහ සෑම සියළු දේ ද එකී අංක 4293 දරන පිඹුරේ කැබලි 5 යනුවෙන් පෙන්නුම් කර ඇති අඩි 12ක පළලැති මාර්ග ප්‍රවේශය භාවිතා කිරීමේ අයිතිය ද වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 99/97 හි ලියාපදිංචි කර ඇත.

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාව තුළ නාගොල්ල හි පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මයා විසින් සාදන ලද 1999.08.22 දිනැති අංක 4293 දරන පිඹුරේ කැබලි 03 යනුවෙන් පෙන්නුම් කර ඇති "වත්තේ ගෙදර වත්ත" (දකුණ කොටස) යයි හඳුන්වනු ලබන ඉහත කී අංක 4293 දරන පිඹුර අනුව වයඹදෙසට : අංක 4293 දරන පිඹුරේ කැබලි 1 ද, ඊශානදෙසට : ඉහත කී අංක 4293 දරන පිඹුරේ කැබලි 2 හා එකී අංක 4293 දරන පිඹුරේ කැබලි 5 යනුවෙන් පෙන්නුම් කර ඇති අඩි 12ක පළලැති මාර්ග ප්‍රවේශය ද, ගිනිකොණදෙසට : එකී 4293 දරන පිඹුරේ කැබලි 4 ද, නිරිතදෙසට : ඔය ද, බස්නාහිරට : පාලමගාව වෙල ද මායිම් පර්චස් විසිහයයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 26.5) වපසරියකින් යුත් බෙදා වෙන් කරන ලද සියළු ඉඩම් කට්ටිය හා එහි තුළ ඇති වගාවන් හා අනෙකුත් සියළු දේ ද එකී අංක 4293 දරන පිඹුරේ කැබලි 5 යනුවෙන් පෙන්නුම් කර ඇති අඩි 12ක පළලැති මාර්ග ප්‍රවේශය භාවිතා කිරීමේ අයිතිය ද වේ. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 99/98හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන්. විජේවර්ධන මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මාතලේ.

10-831

---

**මහජන බැංකුව - මූලස්ථාන ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.07.30 වැනි දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටී.

මහජන බැංකු වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩබ්. අමරසිංහ විසින් සහතික කරන ලද 2009.08.25 වැනි දින අංක 8519 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ගාමිනී පහලවත්ත සහ ක්‍රිස්ටින් ඉන්ද්‍රානි පහලවත්ත විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 8519 දරන උකස් බැඳුම්කරය මත දැනට රුපියල් එක් මිලියන එක් ලක්ෂ හතලිස් දෙදහස් නවසිය දාහතයි ශත දහනවයක (රු. 11,42,917.19) මුදලක් මහජන බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

2009.10.28 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා රුපියල් එක් මිලියන එක් ලක්ෂ හතලිස් දෙදහස් නවසිය දාහතයි ශත දහනවයක (රු. 11,42,917.19) මුදලක් සඳහා වර්ෂයකට සියයට විසිතුනයි දශම පහක් වූ (23.5%) තදුරටත් වූ පොළියක් ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම් අඩු කිරීමෙන් පසු සහ වෙනත් විකිණීමේ පිරිවැය සහ ගාස්තු ද සමග එකී රුපියල් එක් මිලියන එක් ලක්ෂ හතලිස් දෙදහස් නවසිය දාහතයි ශත දහනවයක් වූ (රු. 11,42,917.19) මුදලක් අයකර ගැනීම සඳහා අංක 8519 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දෙසිකරු ඊ. එස්. රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටියි.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මාදිවෙල පිහිටා ඇත්තා වූ ද, ඔබහේනපාරේ වරිපනම් අංක 44/9 දරන සහ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද 1985.03.08 දින අංක 1821ඒ දරන පිඹුරේ "ලොට් අංක 20" ලෙස නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, උතුරට : ලොට් අංක 24 (මාර්ග රක්ෂිතය) ද, නැගෙනහිරට : ලොට් අංක 21 ද, දකුණට : ප්‍රජා පාර වරිපනම් අංක 18/18 ද, සහ බටහිරට : ලොට් අංක 19 ද යන මායිම් තුළ පිහිටියා වූ ද, "දෙල්ගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එම් 2904/136 යටතේ ලියාපදිංචි වී ඇත්තාවූ ද ප්‍රමාණයෙන් පර්චස් 11.5ක් වූ (අ. 0, රූ. 0, පර්. 11.5) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ තුළ වූ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී අංක 1821ඒ දරන පිඹුරේ ලොට් අංක 24, 25 සහ 26 ලෙස නිශ්චිතව දක්වා ඇති මාර්ගය සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස හරහා සහ ඒ ඔස්සේ යෑම සඳහා වූ මාර්ග අයිතිය ද ඊට අයත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
කොළඹ දකුණ.

මහජන බැංකුව,
කලාප මූලස්ථානය - (බස්නාහිර කලාපය - 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01

10-785

---

**මහජන බැංකුව - වාද්දුව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී(29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් 2010.07.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ද සිල්වා මිය විසින් සහතික කරන ලද 2008.07.29 වැනි දිනැති අංක 2513 උකස්කරය ප්‍රකාර ගෙවීම්, හෙට්ටි කංකානම්ගේ සනත් කුමාරසිරි පෙරේරා මහතා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හතලිස් අටලක්ෂ හැත්තෑදෙදහස් අටසිය අසූඑකයි ශත තිස්නමය (රු. 48,72,881.39) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2009.09.02 වැනි දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් හතලිස් අටලක්ෂ හැත්තෑ දෙදහස් අටසිය අසූ එකයි ශත තිස්නමය (රු. 48,72,881.39)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී අත්නම් ඒවා අඩුව එකී රුපියල් හතලිස් අටලක්ෂ හැත්තෑ දෙදහස් අටසිය අසූඑකයි ශත තිස්නමයක් (රු. 48,72,881.39) අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ගනේවල පතිරනගේ ආනන්ද මයා විසින් එකී අංක 2513 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උපලේඛනය

පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 465/196 දරන පත්‍ඉරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබද්දේ, වෑකඩ ග්‍රාමයේ පිහිටි "පණ්ඩිතයාවත්ත" නමැති ඉඩමට අවසරලත් මානක වයි. බී. කේ. කොස්තා මහතා විසින් 1999.04.25 වැනි දින මැන සකස් කරන ලද අංක 3097 දරන පිඹුරේ සඳහන් ලොට් ඒ2ඊ දරන ඉඩමට මායිම්, උතුරට : කෝන්ගහ වත්ත ද, නැගෙනහිරට : දේවාලය හෙවත් කෝවිල් ගොඩැල්ල ද, දකුණට : අංක 3144 දරන පිඹුරේ ලොට් බී දරන කට්ටිය ද, බස්නාහිරට : ඉහත කී පිඹුරේ ඒ2ඩී සහ ඒ2එෆ් දරන කට්ටිය ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි, දශම හතර (අ. 0. රූ. 0, පර්. 12.4) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියළුම ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දේද වේ.

තව ද ඉහත කී වයි. බී. කොස්තා අවසරලත් මිනින්දෝරු මහතාගේ 1998ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින මැන සාදන ලද අංක 3097 සහ 3072 දරන පිඹුරුවල සඳහන් ලොට් ඒ2එෆ් සහ ඒ1ඡ් දරන කට්ටි වූ පාරවල් සෑම අන්දමින්ම මාර්ග ප්‍රවේශයක් ලෙස පාවිච්චි කිරීමට හැකි අයිතිය හා බලය ද ඇතිව වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කළුතර),

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර),
අංක 341, ගාළු පාර,
පානදුර.

10-786

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

සීමාසහිත ප්‍රින්සස් එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගම, අංක 55, ස්ටේස් පාර, කොළඹ 14.

2010.05.24 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

### ඉහත සඳහන් යෝජනාව

1. මහජන නොතාරිස් එස්. එච්. රණවක විසින් සහතික කරන ලද 1998.03.13 දිනැති අංක 1367 දරන බැඳුම්කරය මත අයිරා ගිණුම මත මුල් මුදල හා 2010.02.15 දින තෙක් පොළිය වශයෙන් රුපියල් හැටඑක්ලක්ෂ විසිපන් දහස් එකසිය පනහයි ශත හැටහයක (රු. 61,25,150.66) මුදලක් සමග රුපියල් හතලිස් ලක්ෂයක (රු. 40,00,000) මුදලක් මත වසරකට සියයට පහළොව (15%) බැගින් පොළියක් ද, 2010.02.16 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සීමාසහිත ප්‍රින්සස් එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගමෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1367 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හැටඑක්ලක්ෂ විසිපන් දහස් එකසිය පනහයි ශත හැටහයක (රු. 61,25,150.66) මුදල සමග 2010.02.16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකු, සම්බන්ධතා කළමනාකරු (අයකර ගැනීම් - ආයතනික) ට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, කහඹිලිහේන ග්‍රාමයේ පිහිටි වරපලාන එස්ටේට් (කොටසක්) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ටී. පී. ආර්. අහුගම්මන විසින් 1997 අප්‍රේල් මස 26 වැනි දින සාදන ලද අංක 50/1997 දරන පිඹුරේ ලොට් 2 ලෙස සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදා වෙන් කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඒ. ඩැනියෙල් විසින් අඳින ලද අංක 933 දරන පිඹුරේ (එම ඉඩමේ කොටසක්) ලොට් අංක 2 ද, දකුණට : කුඹුර සහ කුඹුර වෙන් කරන ඇල ද, බස්නාහිරට : ලොට් 1 සහ 3 ද, මායිම්ව එකී අංක 50/1997 දරන පිඹුර ප්‍රකාර අක්කර එකයි රූඩ් තුනයි පර්චස් තිස්දෙකයි දශම හතයි පහක (අ. 1, රූ. 3, පර්. 32.75) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 515/63 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

එකී කහඹිලිහේන ග්‍රාමයේ පිහිටි වරපලාන එස්ටේට් (කොටස) නමැති ඉඩමේ අංක 50/1997 දරන පිඹුරේ ලොට් 3 (පොදු පාරකින් කොටසක්)

ලෙස සීමා නිර්ණය කොට නිරූපණය කර බෙදා වෙන් කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : පාර ද, බස්නාහිරට : ලොට් 1 ද මායිම්ව අංක 50/1997 දරන එකී පිඹුර ප්‍රකාර පර්චස් දෙකයි දශම පහයි පහක (අ. 0, රූ. 0, පර්. 2.55) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියළු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 515/60 යටතේ ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට දකුණු මායිමේ සිට උතුරු මායිමට අඩි දහ අටක් පළල සහ අඩි එකසිය විස්සක් දිග නැගෙනහිර මායිම දිගට අඩි දහඅටක් පළල සහ අඩි එකසිය විස්සක් දිග ඇති ඉඩම මතින් පාරේ අයිතිය ද ඇත.

වරපලාත පිහිටි කැකුණගහකුඹුර නමැති ඉඩමේ ලොට් C (පොදු පාරක කොටසක්) ලෙස සීමා නිර්ණය කොට නිරූපණය කර බෙදා වෙන්කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් C, උතුරට : සී. පී. වික්‍රමසිංහගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් D ද, දකුණට : කේ. මේනිස් අප්පුහාමිගේ ඉඩම සහ ඕපාත් ඇල්ල දක්වා පාර ද, බස්නාහිරට : ලොට් B ද මායිම්ව රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E515/61 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන නොතාරිස් එස්. එච්. රණවක විසින් සහතික කරන ලද 1998.03.31 වැනි දිනැති අංක 1367 දරන උකස් බැඳුම්කරය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්න බණ්ඩා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම් ආයතනික).

ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

10-837

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.06.19 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් මහත්මිය විසින් සහතික කරන ලද 1995.08.30, 1998.05.22, 2002.04.04, 2004.09.20 දිනැති අංක 1410, 2196, 3257, 3931 යන උකස් බැඳුම්කර දරන බැඳුම්කර මත මුල් මුදල හා 2010.04.01 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් අනූහතර ලක්ෂ පනස් හතර දහස් දෙසීය අනූහතයි ශත පහක (රු. 94,54,297.05) මුදලක් සමග රුපියල් අනූලක්ෂයක් (රු. 90,00,000) මත වසරකට සියයට දහනවය (19%) බැගින් පොලියක් ද, 2010.04.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 06, හාමර්ස් ඇවනිව්, අංක 5/7හි පදිංචි එස්. නිත්සිංහම් මහතා, සහ එෆ්. එස්. නිත්සිංහම් මහත්මියගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1410, 2196, 3257, 3931 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් අනූහතර ලක්ෂ පනස් හතර දහස් දෙසීය අනූහතයි ශත පහක (රු. 94,54,297.05) මුදල සමග 2010.04.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකු වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකු, වැල්ලවත්ත ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ, වැල්ලවත්ත දකුණ, හාමර්ස් ඇවනිව් හි පිහිටි හාමර්ස් ඇවනිව් වරිපනම් අංක 7/5 සහ 7/5 1/1 දරන බලයලත් මිනින්දෝරු කේ. කේ. තිරුණාවුකරසු විසින් සාදන ලද 1978 නොවැම්බර් මස 13 වැනි දිනැති අංක 2425 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කර නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල (999 වෙළුමෙහි 191, 193, 195 සහ 197 පත්‍රිරුවල පිළිවෙලින් ලියාපදිංචි කර ඇති වැල්ලවත්ත හෙවත් කාපිරිගෙවත්ත නමැති ඉඩමෙහි 376MIDC, 376MIDD, 376MIDE, 376MIDF යන ලොට් වල ඒකාබද්ධ කිරීමක උප බෙදීමකි)

එනම් එකී ලොට් 3 උතුරට : ලොට් 376MIDG (ලොට් 376MIC පෞද්ගලික විදිය පුළුල් කිරීමට අත්හරින ලද) අංක 2425 දරන එකී පිඹුරෙහි ලොට් 4, හාමර්ස් ඇවනිවු වරිපනම් අංක 7/4 දරන ලොට් 376MIDB ද, නැගෙනහිරට : PP14198 වැල්ලවත්ත පොලිස් ස්ථාන පරිශ්‍රය ද, දකුණට : එකී අංක 2425 දරන පිඹුරේ ලොට් 2 ද, බස්නාහිරට : ලොට් 376MIB3 පුද්ගලික විදිය ද, මායිම්ව අංක 2425 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටක (අ. 0, රූ. 0, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති හා වැවෙන ගහකොළ, වැවිලි හා ගොඩනැගිලි ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල් 162/116 හි ලියාපදිංචි කර ඇති අතර පහත සඳහන් ඉඩම මතින් පාරේ අයිතිය ද ඇත.

එකී වැල්ලවත්ත දකුණ පිහිටි වැල්ලවත්ත ලියාපදිංචි පිඹුරු අංක 2හි ලියාපදිංචි කරන ලද ලොට් 376MIB හි උප බෙදුමක් වූ 78 වෙළුමෙහි 159 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි ලොට් 376MIB3 (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කර බෙදන ලද ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 376MIC (පාරට වෙන්කළ කොටස) නැගෙනහිරට : ලොට් 376MID, දකුණට : ලොට් 376MIB2 සහ බස්නාහිරට : ලොට් 376MIB1 ද, මායිම්ව බලයලත් මිනින්දෝරු එස්. ජෙගදීසන් විසින් සාදන ලද 1962 පෙබරවාරි මස 18 වැනි දිනැති අංක 948 දරන මැනුම් පිඹුර ප්‍රකාර පර්චස් හතරයි දශම හයයි එකක (අ. 0. රූ. 0, පර්. 4.61) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල 160/166හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
වැල්ලවත්ත.

10-835

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

රත්මලාන, බොරුපන පාර, සඟබෝ මාවත, අංක 28හි පදිංචි මහමරක්කලගේ හේෂාන් හිරන්ත ද සිල්වා මහතාගේ ණය වගකීම් සඳහා උකස් කරන ලද දේපළ.

2009.11.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 2007.04.19 වැනි දිනැති අංක 4843 දරන බැඳුම්කරය මත මත සුරකුම් කරනු ලැබ බැංකුව විසින් ප්‍රදානය කරන ලද රුපියල් අසූලක්ෂයක (රු. 80,00,000) ණය මුදල, මහ මරක්කලගේ හේෂාන් හිරන්ත ද සිල්වා විසින් ගෙවීම පැහැර හැර ඇති බැවින් ණය මත 2009.10.14 දිනට පිටිහිටි මුදල වන රුපියල් එක්කෝටි පන්ලක්ෂ විසිහය දහස් දෙසීය හැත්තෑහතක (රු. 1,05,26,277) මුදලක් සහ රුපියල් හැත්තෑනව ලක්ෂ හැත්තෑතුන් දහස් හයසිය එකොළහයි ශත අසූහතක (රු. 79,73,611.87) මුදලක් මත වසරකට සියයට විසිහතර (24%) බැගින් 2009.10.15 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොළිය ද, රත්මලාන, බොරුපන පාර, සඟබෝ මාවත, අංක 28හි පදිංචි මහමරක්කලගේ හේෂාන් හිරන්ත ද සිල්වා මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 4843 දරන බැඳුම්කරය මත 2009.01.14 දිනට අයවිය යුතු එකී රුපියල් එක්කෝටි පන්ලක්ෂ විසිහය දහස් දෙසීය හැත්තෑහතක (රු. 1,05,26,277) මුදල සමග රුපියල් හැත්තෑනව ලක්ෂ හැත්තෑතුන් දහස් හයසිය එකොළහයි ශත අසූහතක (රු. 79,73,611.87) මුදලක් මත 2009.10.15 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී. කරුණාරත්න (ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස්) එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකු, මහරගම අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ කල්දෙමුල්ල, ලක්ෂපතියෙහි අංක 1 දරන කොට්ඨාසයේ මොරටුව කල්දෙමුල්ලෙහි පිහිටි කල්දෙමුල්ල පාරේ, වරිපනම් අංක 79 දරන "අලුබෝගහකුරුඳුවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජේ. ජයවික්‍රම විසින් සාදන ලද 1995 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 600 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2, උතුරට : කල්දෙමුල්ල පාර හා කල්දෙමුල්ල පාරේ වරිපනම් අංක 59A දරන දේපළ (අංක 593 දරන පිඹුරෙහි ලොට් 1) ද, නැගෙනහිරට : කල්දෙමුල්ල පාරේ වරිපනම් අංක 59A දරන දේපළ පිඹුරු අංක 593හි ලොට් 1) සහ රෙක්ස් මාවත ද, දකුණට : කල්දෙමුල්ල පාර - රෙක්ස් මාවතේ වරිපනම් අංක 71/5 දරන දේපළ ද, බස්නාහිරට : කල්දෙමුල්ල පාරේ වරිපනම් අංක 61 දරන දේපළ ද මායිම්ව අංක 600 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතක (අ. 0, රූ. 0, පර්. 17) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි සහ සියළු දේ ද වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2268/274හි දැනට නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

එකී කල්දෙමුල්ල අංක 1 දරන කොට්ඨාසයෙහි ලක්ෂපතියෙහි කල්දෙමුල්ලෙහි පිහිටි "අලුබෝගහකුරුඳුවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1971 ජූනි මස 15 වැනි දිනැති අංක 4684 දරන පිඹුරෙහි ලොට් 25 (අඩි 20 පළල පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 25, උතුරට : කල්දෙමුල්ල පාර ද, නැගෙනහිරට : එම ඉඩමේ කොටසක් ද, දකුණට : ඊබර්ට් පටුමග ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 16. 15, 6 සහ 5 ද මායිම්ව අංක 4684 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහඅටයි දශම දෙකයි පහක (පර්. 18.25) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1504/214හි ද දැනට නුගේගොඩ/දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

සී. ජී. එන්. ප්‍රේමතිලක,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහරගම.

10-836

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ. ඩබ්ලිව්. වීරසිංහ
ගිණුම් අංක : 1069 5336 1479

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2008 මාර්තු 14 දාතම හා අංක 2064 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කේෂර වික්‍රම් වීරසිංහ යන අය බන්ධනදායී වශයෙන් පැහැරහැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර ලක්ෂ හය දහස් හයසිය හැට අටයි ශත තිස් අටක (රු. 4,06,668.38) මුදලක් 2010 ජූලි මස 21 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාර ලක්ෂ හය දහස් හයසිය හැට අටයි ශත තිස් අටක (රු. 4,06,668.38) මුදලද 2010 ජූලි 22 සිට අංක 2064 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ අනූ නම දහස් පන්සිය හතලිස් පහයි ශත තිස් එකක (රු. 3,99,545.31) මුදලක් සඳහා වාර්ෂිකව සියයට

විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2064 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දකුණු පිටිපන පිහිටි දැන් "මුරේත්වේට් එස්ටේට්" යයි කියනු ලබන අඹහේන (පිටිපන කොට්ඨාසය) යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. කේ. එස්. බමුණුසිංහ යන අය විසින් සාදන ලද 2007 නොවැම්බර් මස 18 දාතම හා අංක 915 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : අංක 76/3608 දරන පිඹුරේ ලොට් H සහ ලොට් 1 හී ඉතිරි කොටස නැගෙනහිරට : අංක 76/3608 දරන පිඹුරේ ලොට් H සහ ලොට් 4 දකුණට : ලොට් 4, ආර් 1 සහ 2 සහ බස්නාහිරට : අංක 76/3608 දරන පිඹුරේ ලොට් 1 හී ඉතිරි කොටස සහ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හතරයි බිංදුවක් (අ. 0. රූ. 0, පර්. 11.40) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොල වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 915 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ජී 1788/166 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අංක 2007/31ඒ දරන එකී පිඹුරේ ලොට් 13 (අඩි 20 පළල පාර)

අංක 2007/31ඒ දරන එකී පිඹුරේ ලොට් ආර් 1.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-849/6

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 වැනි අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.03.18 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී විශේෂයෙන්ම හා ඒකමතිකව තීරණය කරන ලදී

1. මහජන නොතාරිස් බන්දුමතී බෝධිනායක රණසිංහ විසින් සහතික කරන ලද 1997.02.13 දිනැති අංක 3105 දරන බැඳුම්කරය මත අයිරා ගිණුම මත මුල් මුදල හා 2010..02.15 දින තෙක් පොළිය වශයෙන් රුපියල් එක්කෝටි විසිදෙලක්ෂ අනූ දෙදහස් හත්සිය හතලිස් එකයි ශත පනස් නවයක (රු. 1,22,92,741.59) මුදලක් සමග රුපියල් විසිලක්ෂයක (රු. 20,00,000) මුදලක් මත වසරකට සියයට පහළොව (15%) බැගින් පොළියක් ද, 2010.02.16 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ගල්හේනගේ අජිත් බන්දුලසේන යනුවෙන් ද හඳුන්වන ගල්හේනගේ බන්දුලසේන සහ උදේශිකා පද්මසීලි ගල්හේනගේ ගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3105 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි විසිදෙලක්ෂ අනූදෙදහස් හත්සිය හතලිස් එකයි ශත පනස් නවයක (රු. 1,22,92,741.59) මුදල සමග 2010.02.16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ සම්බන්ධතා කළමනාකරු (අයකර ගැනීම්-ආයතනික) ට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, උප දිසාපති කොට්ඨාසයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ නාරාහේන්පිට, අංක 34 දරන කොට්ඨාසයේ පිහිටි නිදන කාමර 3ක් කෑම සහ විසිත්ත කාමරයක්, මුළුතැන් ගෙයක්, විවෘත ආලින්දයක් සහ නානකාමර 3කින් සමන්විත වූ ද, ඇල්විටිගල මාවතේ, වරිපනම් අංක 286 දරන සර්වේයර් ජනරාල් වෙනුවෙන් කොළඹ කොට්ඨාසයේ මැනුම් අධිකාරී වී. එම්. දයාවංශ විසින් සහතික කරන ලද 1993 ඔක්තෝබර් මස 24 වැනි දිනැති අංක 7422 දරන සහාධිපත්‍ය මූලික පිඹුරෙහි අංක 8 වැනි වගන්තියෙහි 2E/FO/U2 ලෙස දක්වා නිරූපිත නේවාසික ඒකකයක් වූ සහාධිපත්‍ය ඒකක P. P. Co හි ලොට් 2හි නිර්මාණය කරන ලද තට්ටු නිවාසයෙහි බිම් මහලෙහි පිහිටි එමෙන්ම නේවාසික ස්ථානයක් සේ භාවිතා කරන සහ එකී පිඹුරෙහි අංක 8 වැනි වගන්තියෙහි 2CE1 ලෙස දක්වා නිරූපණය කර ඇති පොදු ප්‍රදේශවලට ඉතාම ආසන්න ප්‍රවේශය සහිත මෙයට පහත දැක්වෙන මායිම් ඇත.

උතුරට : 2CE1 පොදු අංශය වෙන් කරන බිත්තියෙහි මධ්‍යය සහ 2E/FO/U2/A1 අතිරේක ඒකකය වෙන් කරන බිත්තියෙහි මධ්‍යය, නැගෙනහිරට : 2CE1 පොදු අංශය වෙන් කරන බිත්තියෙහි මධ්‍යය, දකුණට : 2CE1 පොදු අංශය වෙන් කරන බිත්තියෙහි මධ්‍යය, බස්නාහිරට : 2CE1 පොදු අංශය වෙන් කරන බිත්තියෙහි මධ්‍යය, මුදුණට : 2CE1 ඒකකය වෙන් කරන බිමෙහි මධ්‍යය, පහළට : බිම් මහලෙහි මධ්‍යය

මෙය වර්ග මීටර එකසිය දාහතක (ව. මී. 117) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con. A41/107 හි ලියාපදිංචි කර ඇත.

එකී නාරාහේන්පිට අංක 34 කොට්ඨාසයෙහි පිහිටි 2E/FO/U2 ඒකකයට අතිරේක ඒකකයක් වූ අංක CO 7422 දරන එකී සහාධිපත්‍ය මූලික පිඹුරෙහි 8 වැනි වගන්තියෙහි නිරූපිත 2E/FO/U2/A1 ලෙස දක්වා ඇති එකී පිඹුරෙහි 8 වැනි වගන්තියෙහි නිරූපිත 2CE1 ලෙස දක්වා ඇති පොදු අංශවලට ඉතා ආසන්නතම ප්‍රවේශය සහිත වූ වාසස්ථානයසේ භාවිතා කරනු ලබන P.P.CO. 7422 හි නිර්මාණය කරන ලද තට්ටු නිවාසයෙහි බිම් මහලෙහි පිහිටියා වූ සහාධිපත්‍ය අතිරේක ඒකකයට මායිම් පහත පරිදි වේ.

උතුරට : 1CE1 පොදු අංශ වෙන් කෙරෙන බිත්තියෙහි මධ්‍යය, නැගෙනහිරට : 1F/FU/U2 පොදු ඒකක වෙන් කෙරෙන බිත්තියෙහි මධ්‍යය, දකුණට : 1CE1 පොදු අංශ වෙන් කෙරෙන බිත්තියෙහි මධ්‍යය, බස්නාහිරට : 1CE1 පොදු අංශ වෙන් කෙරෙන බිත්තියෙහි මධ්‍යය, මුදුණට : 1E/F1/U2/A1 අතිරේක ඒකකය වෙන් කෙරෙන බිමෙහි මධ්‍යය, පහලට : බිම් මහලෙහි මධ්‍යය

එකී නාරාහේන්පිට අංක 34 කොට්ඨාසයෙහි පිහිටියා වූ ද, PPCO 7422 හි ලොට් 2හි ඉදිකර ඇති තට්ටු නිවාසයෙහි බිම් මහලෙහි පිහිටි, නේවාසික ස්ථානයක් සේ භාවිතා කරන එමෙන්ම 2CE1 ලෙස දක්වා ඇති පොදු ප්‍රදේශවලට ඉතාම ආසන්න ප්‍රවේශය සහිත 4E/FO/U2 ඒකකයට අනුබද්ධ වාහන නැවතුම්පලක් සේ දක්වා ඇති අංක CO7422 දරන එකී සභාධිපත්‍ය මූලික පිඹුරෙහි 10 වැනි වගන්තියෙහි 21FO/U2/A2 ලෙස දක්වා ඇති සභාධිපත්‍ය ඒකකයට මායිම් පහත පරිදිය.

උතුරට : 2CE1 පොදු අංශය වෙන් කරන රේඛාවෙහි මධ්‍යය, නැගෙනහිරට : 2CE1 පොදු අංශය වෙන් කරන රේඛාවෙහි මධ්‍යය, දකුණට : 2CE1 පොදු අංශය වෙන් කරන රේඛාවෙහි මධ්‍යය, බටහිරට : අතිරේක ඒකක 21/F1/U2/A2, මුදුණට : පාරෙහි මධ්‍යය, පහළට : බිම් මහලෙහි මධ්‍යය,

මෙය වර්ග මීටර් දාහතරක (ව. මී. 14) බිම් ප්‍රමාණයකින් යුක්ත ය.

*පොදු අංශ :*

සභාධිපත්‍ය දේපලෙහි පොදු අංශ ලොට් 2හි පිහිටි 2CE1 සහ ලොට් 1හි පිහිටි 1CE1 ලෙස නිරූපිත පොදු අංශ, වාහන නැවතුම් ස්ථාන, විවෘත අවකාශ, වතුර රැස්කරන ටැංකි, කැලිකසල එකතු කරන කාමර, දොරටුව, ප්‍රවේශ ශාලා, අපද්‍රව්‍ය බැහැර කරන නල, කොරිඩෝ, සේවා නල, සීමා බිත්ති, අත්තිවාරම්, බාහිර තුළාඳ මුක්කු, කුළුණු, ප්‍රධාන බිත්ති, වහල, විදුලිය සැපයීමේ රැහැන්, තරප්පු පෙළවල් තරප්පු තට්ටුව හා පාර යනාදියෙන් සමන්විත වේ.

2E/FO/U2 ට අයත් පොදු අංශවල කොටස - 136
පොදු අංශවල කොටස් ප්‍රතිශතය - 2.90%

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්නබණ්ඩා,
සම්බන්ධතා කළමනාකරු,
(අයකර ගැනීම් ආයතනික).

ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 04, ලංකා බැංකු මාවත,
කොළඹ 01

10-838

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත තරිඳු වොෂින් (පුද්ගලික) සමාගම.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 4326 සහ 2005 මැයි මස 04 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කඩවත, කිරිමැටියාගාර අංක 330/1A දරන ස්ථානයේ සීමාසහිත තරිඳු වොෂින් (පුද්ගලික) සමාගම විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් ඉහත සමාගම් කොටස්කරුවෙකු සහ අධ්‍යක්ෂවරයෙකු වන කඩවත මහර අංක 348 දරන ස්ථානයේ පදිංචි සුමිත් වික්‍රමාරච්චි යන අය විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත සඳහන් සීමාසහිත තරිඳු වොෂින් (පුද්ගලික) සමාගම ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදුකර ඇති බැවින් ද,

අයිරා පහසුකම් මත හිඟ මුදල වන රුපියල් දහහත්ලක්ෂ පන්දහස් හාරසිය අනූ එකකුත් ශත දෙකක මුදල (රු. 17,05,491.02) සහ 2010.07.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත එකග වූ පරිදි (වැල්පොලී පදනමින්) තවදුරටත් පොළිය ද, ඊට සම්බන්ධ ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද, එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්. දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ අධිකාරි පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ වැලිසර උප කාර්යාල සීමාව තුළ කිරිමැටියාගාර ගමේ පිහිටි කිරිමැටියාගාර පාරේ වරිපනම් අංක 190/7 දරන කොස්ගහඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු රත්න හෙට්ටිආරච්චි විසින් මැන සාදන ලද අංක 148/1996 සහ 1996 නොවැම්බර් මස 20 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් B1 දරන බිම් කොටසට මායිම්, උතුරට : ජේ. ඒ. නිකුලස් සහ තවත් අයගේ කුඹුර ද. නැගෙනහිරට : ලොට් B2 ද, දකුණට : අංක 214/1985 දරන පිඹුරේ ලොට් E (අඩි 10ක් පළල) පාර ද, බස්නාහිරට : අංක 214/1985 දරන පිඹුරේ දැනට ප්‍රසාද්ගේ ලොට් A ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 148/1996 දරන පිඹුර අනුව පර්චස් දහහතයි දශම නමයයි පහක (අ. 0, රූ. 0, පර්. 17.95) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගොඩනැගිලි, පස්, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමග ය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C730/43 දරන හිමිකම් වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත බිම් කොටසට ලොට් E (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගමේ ලේකම්,

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

10-702

### ලංකා බැංකුව-ගම්පොළ ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. සී. සී. ඒකනායක මිය විසින් සහතික කරන ලද 2007.03.02 දිනැති අංක 2389 දරන උකස්කරය මත මුල් මුදල (2010.06.21 වැනි දින වන විට ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් හයදහස් එකසිය හැත්තෑ අටයි ශත දහ නමයක (රු. 6,178.19) මුදල බැහැර කොට හා අයිරා ගිණුමේ 2010.06.21 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් පහළොස් ලක්‍ෂ තිස් එක් දහස් හාරසිය තිස්තුනයි ශත හැට නමයක (රු. 15,31,433.69) මුදල සමඟ අනුමත කළ සීමාව වන රුපියල් දස ලක්‍ෂයක (රු. 10,00,000) මුදල් මත (ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් හයදහස් එකසිය හැත්තෑ අටයි ශත දහනවයක (රු. 6,178.19) මුදල බැහැර කොට 2010.06.22 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට පහළොවක (15%) වාර්ෂික පොළියක් ද ගම්පොළ, ජයමාලපුර, 6 වන පටුමග, අංක 831/2/1 දරන ස්ථානයේ පදිංචි ප්‍රියන්ත කුමාර නාමල් ජයරත්න මයා හා වීසිං මුදියන්සේලාගේ ජගත් කුමාර බණ්ඩාර හෙවත් වීරසිංහ මුදියන්සේලාගේ ජගත්කුමාර බණ්ඩාර මයා යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන්වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2007.03.02 දිනැති අංක 2389 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පහළොස් ලක්‍ෂ තිස්එක් දහස් හාරසිය තිස්තුනයි ශත හැට නමයක (රු. 15,31,433.69) මුදල (2010.06.21 වැනි දින වනවිට ස්ථිර අයිරා සීමාව ඉක්මවා අයිරා ගන්නා ලද රුපියල් හයදහස් එකසිය හැත්තෑ අටයි ශත දහනවයක (රු. 6,178.19) මුදල බැහැරකොට සමඟ 2010.06.22 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කරන ලද මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත, ගඟ ඉහළ කෝරළේ, ගම්පොළවෙල ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු පී. ආර්. ටී. බී. රත්නායක මයා විසින් සාදන ලද 2006.10.13 දිනැති අංක 4078 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති "මරියා වත්ත" යයි හඳුන්වනු ලබන, උතුරට : පාර හා ඉතිරි කොටස ද, නැගෙනහිරට : ඉතිරි කොටස ද, දකුණට : ඉතිරි කොටස ද, බස්නාහිරට : පාර හා ඉතිරි කොටස ද මායිම් වූ රූඩ් එකයි පර්චස් විසි හතරයි දශම දෙකක් (අක්. 0, රූ. 1, පර්. 24.2) හෝ හෙක්ටයාර් 0.01624ක වපසරියෙන් යුත්, බෙදා වෙන් කරන ලද සියළු ඉඩම් කට්ටිය, එහි තුළ පිහිටා ඇති නිවස, පස්, ගස්, වගාවන් හා අනෙකුත් සෑම සියළු දේත් වේ.

ඉහත කී ඉඩම හා ස්ථානය පහත සඳහන් ඉඩමේ කොටසක් වේ.

බලයලත් මිනින්දෝරු කේ. එම්. එච්. නවරත්න මයා විසින් සාදන ලද 1974.11.24 දිනැති අංක 2245/10 දරන පිඹුරේ කැබලි 10 යනුවෙන් පෙන්නුම් කර ඇති, "මරියා වත්ත" යයි හඳුන්වනු ලබන, උතුරට : කැබලි 8 හා 9 ද, නැගෙනහිරට : රජයේ ඉඩම ද, දකුණට : කැබලි 12 හා 13 වෙන් කරන අඩි පාර ද, බස්නාහිරට : ගම්සභා පාරද මායිම් වූ රූඩ් තුනක (අක්. 0, රූ. 3, පර්. 0) වපසරියෙන් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල හා එහිතුළ ඇති සෑම සියළු දේත් වේ. මෙය ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී. 247/155හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ජේ. ඒ. පී. එස්. ප්‍රනාන්දු,
කළමනාකරු.

ලංකා බැංකුව,

10-832

---

### මහජන බැංකුව - නුවරඑළිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.03.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරනලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

නුවරඑළියේ ප්‍රසිද්ධ නොතාරිස් ජයමිණි අඹගහවත්ත විසින් සහතික කරන ලද 2008.09.30 දිනැති අංක 894 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම ගුණවික්‍රම දොන් සුගතදාස සහ සාරුවේ කංකානම්ගේ සුරංගි නිසංසලා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්‍ෂ තිස්දෙදහස් පන්සියයකුත් ශත එකක් (රු. 3,32,500.01) සහ රුපියල් ලක්‍ෂ හතරක (රු. 4,00,000) මුදලක් මහජන බැංකුවට දැනට අය වීමට ඇති බැවින් ද, රුපියල් තුන්ලක්‍ෂ තිස්දෙදහස් පන්සියයකුත් ශත එකක් (රු. 3,32,500.01) මුදලක් සඳහා 2009.01.31 දින සිට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් ද, රුපියල් ලක්‍ෂ හතරක (රු. 4,00,000) මුදලක් සඳහා 2009.01.12 දින සිට වර්ෂයකට සියයට විසිහත (27%) බැගින්ද සහ වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනත යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්‍ෂ තිස්දෙදහස් පන්සියයකුත් ශත එකක් (රු. 3,32,500.01) මුදලක් සහ රුපියල් ලක්‍ෂ හතරක (රු. 4,00,000) මුදලක් අයකර ගැනීම සඳහා කොළඹ 5, හැව්ලොක් පාරේ අංක 250හි බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් එකී අංක 894 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතුයැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපල පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළේ තලවාකැලේ ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ තලවකැලේ ග්‍රාමයේ පිහිටි, වපසරිය පර්චස් තිස්හතයි දශම පහක් වූ (අ. 0, රූ. 0, පර්. 37.5) බෙදා වෙන්කළ හා නිරූපිත ඉඩම් කැබැල්ලට

මායිම්, උතුරට : ක්‍රිස්තියානි පල්ලියට අයිති ඉඩම ද, නැගෙනහිරටः තලවකැලේ නගර සීමාව ද, දකුණට : පියසේනට අයිති ඉඩම ද සහ බටහිරට : හේමචන්‍ද්‍ර මාවත, පැති වීදිය සහ අබ්දුල්ලාට අයිති ඉඩමද යන මායිම් තුළ භූමිය සමග ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේත් වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ නුළු 4/891/2008 යටතේ ලියාපදිංචි කර ඇත.

නැවත බෙදීමකට අනුව ඉහත ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කළ හැක

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළේ තලවාකැලේ ග්‍රාමයේ පිහිටි තලවාකැලේ වත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එච්. එම්. සමරනායක විසින් මැන සාදන ලද 1998.12.12 දින දරන අංක 1598 දරන පිඹුරේ කැබලි අංක 20 ලකුණු කළ බෙදා වෙන්කළ හා නිරූපිත වපසරිය පර්චස් තිස්හතයි දශම පහක් (පර්. 37.5) හෝ හෙක්ටෙයාර බින්දුවයි දශම නමයයි හතරයි අටක් (හෙක්. 0.948) වන ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : ක්‍රිස්තියානි පල්ලියට අයිති ඉඩම ද (මු. පි. නු. 1192 කැබලි අංක 17), නැගෙනහිරට : තලවාකැලේ නගර සීමාව ද (මු. පි. නු. 1192 කැබලි 14), දකුණට : පියසේනට අයිති ඉඩම ද (මු. පි. නු. 1192 කැබලි අංක 21), බටහිරට : අබ්දුල්ලා හිමිකම් කියන තලවාකැලේ වත්ත යන මායිම් තුළ භූමිය සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 40, උද්‍යාන පාර,
නුවරඑළිය.

10-782